IPPF

From choice, a world of possibilities

# ලිංගික අයිතීන් පිළිබඳ :

## සැලසුම් කළ මාපිය භාවය පිළිබඳ ජාත්‍යන්තර සම්මෙලනයේ ප්‍රකාශනය

## Sexual rights: an IPPF declaration



# සැලසුම් කළ මාපිය භාවය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය
# (IPPF- International Planned parenthood Federation)
# ලිංගික අයිතීන්: IPPF ප්‍රකාශනය

## පූර්විකාව

IPPF සියලු මානව හිමිකම්වල විශ්වාසී බව, එකිනෙකට බැඳී ඇති බව එකිනෙක මතම රඳා පවතින බව ආදී මූලිංකාග ඇතුළත් මානව හිමිකම් ප්‍රවේශයක් තුළ සිය අරමුණු සපුරා ගැනීමට කැප වී හිඳියි. IPPF හඳුනා ගන්නා පරිදි ලිංගික අයිතිවාසිකම් යනු සියලු දෙනාගේ නිදහස සමානත්වය හා ගෞරවය විෂයයෙහි දායකත්වය ලබා දෙන ලිංගිකත්වය හා බැඳුණු වර්ධනය වන හිමිකම් සමූහයකි.

**ලිංගික අයිතීන් පිළිබඳ** IPPF ප්‍රකාශනය මූලික මානව හිමිකම් පිළිබඳ ගිවිසුම් හා වෙනත් එවැනි ලේඛන, එම ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ බලාත්මක නිර්වචන, ඒවායින් ප්‍රකට වන මානව ලිංගිකත්වයට අදාළ අතිරේක හිමිකම් ආදිය එක්ව සැකසුණු එකකි. එය 1993 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ ලෝක සමුළුව, 1994 එක්සත් ජාතීන්ගේ සංවර්ධනය හා ජනගහනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව, 1995 එක්සත් ජාතීන්ගේ කාන්තාව පිළිබඳ සිව්වන ජාත්‍යන්තර සමුළුව, එක්සත් ජාතීන්ගේ සහස්‍ර සංවර්ධන අරමුණු හා එක්සත් ජාතීන්ගේ සහස්‍රක ප්‍රකාශනය ආදිය මගින් ප්‍රකාශිත ලේඛන මත පදනම් ව ඇත. එසේ ම එය එක්සත් ජාතීන්ගේ ආයතන ගණනාවක හා විශේෂ නියෝජිතයන්ගේ, විශේෂයෙන් ම 2004 ළඟා විය හැකි ඉහළම සෞඛ්‍ය තත්වයන්ට ඇති අයිතිය පිළිබඳ සොයා බැලීමට පත්කල විශේෂ නියෝජිතයාගේ මානව හිමිකම් කොමිසම වෙත ලබාදුන් වාර්තාව ආදියේ සොයා ගැනීම්, යෝජනා ආදියෙන් ද දැනුවත් භාවය ලබා ඇත.

**ලිංගික අයිතීන්:** IPPF ප්‍රකාශනය ලිංගික හා ප්‍රජනක අයිතීන් පිළිබඳ IPPF ප්‍රකාශය පරිපූර්ණ බවට පත් කරයි. එය ලිංගික අයිතීන් විස්තරාත්මක හඳුනා ගැනීම හා ලිංගිකත්වය පිළිබඳ අන්තර්ගත දැක්මක් සඳහා සහාය වීම අපේක්ෂා කරයි. මෙම දැක්ම වෙනස් කොට නොසැලකීමේ පසුබිමක් තුළ සියලු දෙනා විෂයයෙහි පවතින ලිංගික ස්වාධීනත්වයට ඇති

අයිතිය හා ලිංගික සෞඛ්‍යය ප්‍රවර්ධනයට ඇති අයිතිය ආරක්ෂා කිරීමට හා එයට ගරු කිරීමට අපේක්ෂා කරයි.

IPPF විසින් සියලු මානව අයිතීන් ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂිත වන මූලික අයිතිවාසිකමක් වශයෙන්, සෞඛ්‍යය සලකනු ලබයි. එමෙන් ම ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය සෑම අයෙකුට ම මානසික හා ශාරීරක සෞඛ්‍යයේ ළඟා විය හැකි ඉහළ ම ප්‍රමිතීන්, වින්දනය කළ හැකි අයිතීන් හා සම්බන්ධිත මූලිකාංග ලෙස විශ්වාස කරනු ලබයි. ලිංගික අයිතීන්ගෙන් තොරව ලිංගික සෞඛ්‍යය ළඟාකර ගැනීම හෝ පවත්වා ගෙන යා නොහැකි නමුත් ලිංගික අයිතීන්ට සෞඛ්‍යය සඳහා ඇති හිමිකම්වලට වඩා යමක් ඇතුළත් වේ.

ලිංගික අයිතීන් යනු පවත්නා මානව අයිතිවාසිකම් ලිංගිකත්වය විෂයෙහි යොදා ගැනීමේ දී මතුවන සුවිශේෂී නියමයන් ය. අයිතීන් විෂයයෙහි නිදහස, සමාන බව, පෞද්ගලිකත්වය, ස්වාධීනත්වය, ඒකාග්‍රතාව සියලු පුද්ගලයන්ගේ ගෞරවය හා විශේෂයෙන් ලිංගිකත්වයට අදාළ වන බොහෝ ජාත්‍යන්තර අංගයන්හි හඳුනා ගැනෙන ප්‍රතිපත්ති ඇතුළත් වේ. ලිංගික අයිතීන් යම් යම් අනන්‍යතාව ආරක්ෂා කිරීම අඩංගු වන හා එය ඉක්මවා යන ප්‍රවේශයක් සපයයි. ලිංගික අයිතීන් ප්‍රචණ්ඩත්වයෙන්, වෙනස් කොට සැලකීමෙන් හෝ බලකිරීමෙන් තොර ව මෙන් ම ගෞරවනීය පසුබිමක කෙනෙකුට ම සිය ලිංගිකත්වය සපුරා ගැනීමට හා ප්‍රකාශ කිරීමට ඉඩ ලබා දෙන කොන්දේසි වෙත ප්‍රවේශය ඇති බව සහතික කරනු ලබයි.

ලිංගිකත්වය යනු ජීවිතය පුරා ම මිනිසත් බවේ ප්‍රධානතම අංගයක් වන අතර ම, ලිංගිකත්වයට මතු දැක්වෙන සියලු මාන ඇතුළත් විය හැකි අතර ඒවා සියල්ල ම සෑම විට ම අත්දකින්නේ හෝ ප්‍රකාශ වන්නේ නැති බව IPPF හඳුනා ගනියි. එය ලිංගික ක්‍රියාව ලිංගික අනන්‍යතාව, ලිංගික සතුට, සමීප බව හා වර්ගයා බෝ කිරීම යන සියල්ල ඇතුළත්, වර්ධනය වෙමින් පවතින සංකල්පයකි. එය සකස් වී ඇත්තේ ජෛව විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක, සමාජයීය, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික සදාචාරාත්මක, නෛතික, ඓතිහාසික, ආගමික හා අධ්‍යාත්මික කරුණු සමූහයකිනි. ලිංගිකත්වය ප්‍රකාශ කෙරෙනුයේ සිතිවිලි, ආශාවන්, විශ්වාස, ආකල්ප, වටිනාකම්, හැසිරීම්, පුරුදු හා සබඳතා මාර්ගයෙනි.

ලිංගිකත්වයේ බොහෝ ප්‍රකාශන ප්‍රජනක නොවන බවට හා ලිංගිකත්වය පිළිබඳ ගෝලීය අබෝධය වර්ධනය වන බවට IPPF වෙත වැටහීමක් ඇත. එමෙන් ම, IPPF විසින් ලිංගික අයිතීන් ප්‍රජනක අයිතීන් හා ප්‍රජනක සෞඛ්‍යය විෂයෙහි අන්තර්ගත නොවන අයිතීන් ලෙස සුවිශේෂී ලෙස හඳුනා ගැනීමේ අවශ්‍යතාව අවබෝධ කර ගනියි.

ලිංගික අයිතීන් සඳහා වන කොන්දේසි බලාත්මක කිරීමට කැපවීම මගින්, ජනතාවගේ නිදහස, අයිතීන් හා ගෞරවය පූර්ණ වශයෙන් ම තහවුරු වන, විශ්වීය සමාජීය හා අන්තර්ජාතික පැවැත්ම හා සාමය හා සම්පත් සඳහා සමානාත්මතාව සඳහා වන දේශීය හා ගෝලීය අරගලය සඳහා වඩාත් පුළුල් කැපකිරීමක් සපුරා ගත හැකි බව IPPF හඳුනා ගනියි. සංවර්ධනය සඳහා වන අයිතිය පිළිබඳ පරාසයෙහි පිහිටා ලිංගික අයිතිවාසිකම් සපුරා ගැනීම පුද්ගලයෙකුගේ කේන්ද්‍රීය බවට අත්‍යවශ්‍ය වන්නේ සියලු මනාව අයිතීන් හා මූලික නිදහස පූර්ණ වශයෙන් ම සපුරා ගත හැකි සමාජ, ආර්ථික හා දේශපාලන වර්ධනයේ මූලිකයා, ක්‍රියාශීලී සහභාගිවන්නා හා ප්‍රතිලාභියා වීම නිසා ය.

IPPF විශ්වාස කරනුයේ අයිතිවාසිකම් භුක්ති විඳීම සඳහා වන තත්ත්වයන් නිර්මාණය කිරීම සඳහා වැදගත් අංගයක්, විශ්වාසීය සැකසුම් සංවර්ධනය මත රඳා පවතින බවයි. එවන් සැකසුම් තනි පුද්ගල ප්‍රතිකාර්යයන් හා සැපයීම පමණක් නොව, ලිංගික අයිතිවාසිකම් කඩ වීම සඳහා පාදක වන බලය, යන යාන්ත්‍රණයන් හට අභියෝග කළ යුතු ය. මෙම විෂය පිළිබඳව සේවා සැපයීම හා උපදෙස් ලබා දීමේ උත්සාහයන් විෂයයෙහි  බලපෑනු ඇති බවට විශ්වාස කරයි.

මේ ආකාරයට IPPF එහි සාමාජික සංවිධානයන් හට Sexual Rights : an IPPF Declaration, ලේඛනය ඒවායේ ක්‍රියාකාරකම් තුළින් ලිංගික අයිතීන් ගරු කිරීම ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම සඳහා මෙන්ම ඔවුන්ගේ පවත්නා ප්‍රතිපත්ති, උපක්‍රම හා වැඩසටහන් වඩාත් ශක්තිමත් කිරීම සඳහා යොදා ගැනීමට උනන්දු කරනු ලබයි. Sexual Rights:an IPPF Declaration, යනු මූලික මිනිස් අයිතිවාසිකම් ලිංගික අයිතීන් කෙරෙහි යොදා ගැනීම පිළිබඳ අවබෝධ කොට ගැනීම සඳහා වූ සැකිල්ලකි. සංගමයෙහි සියලු අංශයන්හි  මෙම සැකිල්ල හා එහි මූලධර්ම සිය ක්‍රියාකාරකම්, සේවා හා වැඩසටහන්වලට ලිංගික අයිතීන් ප්‍රවර්ධනය හා

රැකගැනීමේ උත්සාහයක් ලෙසට හා ඒවායේ පවතින ප්‍රතිපත්ති හා උපාය උපක්‍රම ශක්තිමත් කිරීමේ හා වඩාත් වැඩිදියුණු කිරීම සඳහා අන්තර්ග්‍රහණය කළ හැකි ය.

ලිංගික අයිතීන් වෙනස් කළ නොහැකි හා නොබෙදිය හැකි මානව අයිතීන් පිළිබඳ වූ දර්ශනයක් වෙනුවෙන් IPPF කැප වී සිටී. කෙසේ වෙතත් එය, ප්‍රඥප්තියෙහි අඩංගු ප්‍රතිපත්ති හා අයිතීන් ක්‍රියාත්මක කිරීමේ කාලය, ආකාරය හා ප්‍රමාණය කෙරෙහි ඒ ඒ රටවල පසුබිම බලපානු ඇති බව IPPF විසින් හඳුනා ගෙන ඇත. එවැනි තත්ත්ව හඳුනා ගැනීමට හා ඒ පිළිබඳ ව ක්‍රියාත්මක වීමට විශේෂිත ක්‍රියාමාර්ග ක්‍රියාවේ යොදවනු ලැබේ.

## පොදු මූලධර්ම

IPPF එහි සාමාජික සංවිධාන, ප්‍රඥප්තියේ අඩංගු හා එයට පාදක වූ මූලධර්ම ද ඇතුළු සංගමයේ දර්ශනය, මෙහෙවර, වටිනාකම් කෙරෙහි කැපවනු ඇතැයි බලාපොරොත්තු වෙයි. මෙම මූලධර්ම ප්‍රඥප්තියෙහි, ලිංගික අයිතීන් යනු ලිංගිකත්වයට සම්බන්ධ මානව අයිතීන්ය, යනුවෙන් ඇති කොටසේ විශේෂිත ව දක්වා ඇති ලිංගික අයිතීන් පූරණය ප්‍රවර්ධනය හා ආරක්ෂාව සඳහා, සංගමයේ සියළු අංශ විසින් සංවර්ධිත ක්‍රියාකාරකම් හා උපාය උපක්‍රම විෂයයෙහි දැනුවත් විය යුතු ය.

### 1 වැනි මූලධර්මය:

ලිංගිකත්වය සෑම මිනිසකුගේ ම පුද්ගල බවේ විශේෂිත අංගයකි. මේ සඳහා සෑම අයෙකුගේ ම සංවර්ධනයේ අංගයක් ලෙසට සියලු ලිංගික අයිතිවාසිකම් භුක්ති විඳීම සඳහා වන යහපත් පරිසරයක් නිර්මාණය කළ යුතු ය.

ලිංගිකත්වය සෑම සමාජයක ම සෑම මනුෂ්‍යයකුගේ ම පුද්ගල බවේ විශේෂිත අංගයකි. එක් එක් පුද්ගලයන් අභ්‍යන්තර හා බාහිර සාධක අනුව වෙනස් වෙනස් ආකාරයට සිය ලිංගිකත්වය අත්විඳින අතර, ලිංගිකත්වය හා බැඳුණු මානව අයිතීන් සුරැකීම හා ප්‍රවර්ධනය සෑම කෙනෙකුගේ ම සෑම තැනක දී ම සිය දෛනික පැවැත්මේ අංගයක් විය යුතු ය. ලිංගික

අයිතීන් යනු සියලු මිනිසුන්ගේ උපතින් ම දායාද වන නිදහස, ගෞරවය හා සමානාත්මතාව මත පදනම් වූ විශ්වීය මිනිස් අයිතිවාසිකම් ය[7].

දිළිඳු බව යනු ලිංගික සෞඛ්‍ය හීන වීම හා ලිංගිකත්වය පදනම් කරගත් අසමානතාව හා නොසලකා හැරීම සඳහා හේතුව මෙන් ම ඵලය ද වන්නේ ය. වැඩසටහන් සකස් කිරීමේ දී, මිනිස් අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී හා පහත්කොට සැලකීමේදි දී දිළිඳු බවේ කාර්යභාරය විශේෂයෙන් ම ලිංගික අයිතීන් උදෙසා එහි බලපෑම හඳුනා ගනිමින්, දිළිඳු බව හා මෙවැනි කරුණු අතර ඇති සහසම්බන්ධතාව පිළිබඳ සලකා බැලිය යුතු ය.

අයුක්තිසහගත[8] බව, අසමානතාව[9], ස්ත්‍රී පුරුෂ බව පිළිබඳ අසාධාරණ බව[10], ස්ත්‍රී පුරුෂ බව පිළිබඳ අසමානතාව[11], සහ අයහපත් සෞඛ්‍යය යන කරුණු, සහශ්‍රක සංවර්ධන අරමුණු ආදිය මත පදනම් වන ඕනෑ ම සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන් හෝ සැලසුම්වල දී සලකා බලනු ලැබිය යුතු ය. අනෙකුත් අරමුණු අතර සැලසුම්වලදි සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම - මානසික සෞඛ්‍යය වර්ධනය, ළදරු මරණ අනුපාතිකය අඩු කර ගැනීම, ස්ත්‍රී පුරුෂ සමානත්වය ප්‍රවර්ධනය හා එච්.අයි.වී. ඒඩ්ස් තත්වය පාලනය කිරීම - ලිංගික අයිතීන් සුරැකීම හා ලිංගික සෞඛ්‍ය සේවා සඳහා පුළුල් ප්‍රවේශයක් සැලසීම මත සෘජුව ම රඳා පවතී.

ලිංගික හා ප්‍රජනක අයිතීන් පිළිබඳ ප්‍රකාශනය අනුව යමින් IPPF සංවර්ධනයේ කේන්ද්‍රීය විෂයය පුද්ගලයා බව තහවුරු කරන අතර ම ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනික සංවර්ධනයේ ක්‍රියාශීලී සාධකයක් බවට පත්වීම සඳහා සෑම පුද්ගලයකු හට ම සියලු ලිංගික අයිතීන් භුක්ති විඳීමට හැකි යහපත් පරිසරයක් ගොඩනැගීමේ වැදගත්කම අවබෝධ කර ගනී. ලිංගිකත්වය යනු සෑම කල්හි ම ශරීරය, මනස, දේශපාලනය, සෞඛ්‍යය හා සමාජය හා බැඳුණු මානව හා සමාජ ජීවිතයේ අංගයකි.

ලිංගික අයිතීන් දෘෂ්ටිමය වශයෙන් හා දේශපාලනික මෙන්ම පෞද්ගලික ව හා ආත්මීය ව ද බලපෑම් කරනු ලබයි. ලිංගික අයිතීන්හි භාව විෂයක, සම්බන්ධිත හා සහභාගිත්ව මූලධර්මය අඩංගු අතර ගැඹුරු ලෙස ශාරීරික ඒකාග්‍රතාව හා ස්වයං ආධිපත්‍යය සමඟ සම්බන්ධිත ය. ලිංගික අයිතීන් හඳුනා ගැනීමේ දී හා සුරක්ෂිත කිරීමට කැප වීමේ දී, ගෞරවය, ආරක්ෂා හා මෙම අයිතීන් සපුරාලීම මේ සියලු විෂයවල හා මූලධර්මවල අවධානයට යොමු විය යුතු බව IPPF wdh;kh වටහා ගන්නා අතර ම ඒවා අනෙක් අතට මිනිස්

ක්‍රියාකාරකම්වල පොදු හා පෞද්ගලික අංශයන්හි ක්‍රියා හරහා යෙදෙන ඓතිහාසික ක්‍රියාදාමයේ කොටසක් ද වේ.

## 2 වැනි මූලධර්මය:

වයස අවුරුදු 18ට අඩු පුද්ගලයන්ට සහතික කෙරෙන අයිතීන් හා ආරක්ෂාව වැඩිහිටියන්ට ලැබෙනවාට වඩා වෙනස් වන අතර ම එම අයිතීන් දරුවකු විෂයෙහි ක්‍රියාවේ යෙදීමේ දී දරුවාගේ විකාශය වන ශක්‍යතා සැලකිල්ලට භාජනය කළ යුතු ය.

IPPF විසින් වයස අවුරුදු 18ට අඩු පුද්ගලයන් කෙරෙහි සහතික කෙරෙන අයිතීන් හා ආරක්ෂාව, ජාත්‍යන්තර හා ජාතික නීතියේ පරිද්දෙන්, ඇතැම් අවස්ථාවල දී වැඩිහිටියන්ගේ අයිතීන්ගෙන් වෙනස් වන බව අවබෝධ කරනු ලබයි. මේ වෙනස්කම් මානව හිමිකම්වන සියලු පාර්ශවයන් හා අදාළ වන නමුදු ලිංගික අයිතීන් විෂයයෙහි සුවිශේෂී එළඹුම් අවශ්‍යය. IPPF ආයතනය ප්‍රථමයෙන් අවුරුදු 18ට අඩු පුද්ගලයන් අයිතිවාසිකම් දරන්නන්ය යන නිගමනයෙන් හා ළදරු විය, ළමා විය හා නවයෞවනය ආදී විවිධ කාල සීමාවන්වල දී ඇතැම් අයිතීන් හා ආරක්ෂාවන් අඩු හෝ වඩාත් වැඩි අදාළත්වයක් දරන්නේ ය, යන නිගමනයෙන් ආරම්භ කරයි.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියෙහි 5 වැනි වගන්තිය[12] අනුව දෙමාපියන් හෝ වෙනත් අය විසින් දරුවා වෙනුවෙන් වගකීමෙන් සැපයෙන මඟපෙන්වීම් හා යොමු කිරීම් සියල්ලම දරුවාට තමන් විසින් තමන් උදෙසා අයිතීන් ක්‍රියාවේ යොදවා ගැනීමේ හැකියාව අනිවාර්යයෙන් ම සැලකිල්ලට භාජනය කළ යුතු ය. දරුවන්ගේ වර්ධනය වන ශක්‍යතා පිළිබඳ සංකල්පයට, දරුවන් පුරවැසියන් ලෙස ගෞරවයට භාජනය වීමේ අයිතිය සහිත සිය ජීවිතයෙහි ක්‍රියාකාරී නියෝජිතයන් වශයෙන් හඳුනා ගැනීම හා සීඝ්‍රයෙන් වර්ධනය වන ස්වාධීනත්වයක් සහිත අයිතිවාසිකම් දරන්නන් වශයෙන් මෙන් ම ඔවුන්ගේ අනතුරට ලක්වීමේ ස්වභාවය අනුව ආරක්ෂා වීමට අයිතියක් ඇත්තන් වශයෙන් ද හඳුනා ගැනීම අතර සමතුලිත බවක් තිබිය යුතු වේ. මෙම සංකල්පයට අනුව දරුවන් අන්තරාදායක විය හැකි ක්‍රියාකාරකම්වලින් ඔවුන් ආරක්ෂා කිරීමේ මට්ටම් ඔවුන්ගේ කුසලතා වර්ධනයට අනුකූල ව හීන වන බව හඳුනා ගැනෙයි.

මෙයට අමතර ව, හැකියාව වර්ධන මූලධර්මය දරුවන් හට ගරු කිරීම, ඔවුන්ගේ ගරුත්වය සියලු ආකාරයේ හිරිහැරවලින් ආරක්ෂා වීමට ඇති අයිතිය සම්බන්ධ වන අතර ම ඔවුන්ගේ ආරක්ෂාව විෂයයෙහි ඔවුන්ගේ දායකත්වය ද හඳුනා ගැනේ. සමාජයන් විසින් දරුවන්ට ඔවුන්ගේ උපරිම ශක්‍යතා ළඟා කර ගැනීමට හැකි එමෙන් ම ඔවුන්ගේ සහභාගිත්ව හැකියාවට උපරිම වශයෙන් ගරුත්වයක් හා ඔවුන්ගේ ජීවිතය පිළිබඳ තීරණ ගැනීමේ හැකියාව ලබා දෙන පරිසරයන් ගොඩනැගිය යුතු ය.

දරුවන්ගේ අයිතිවාසිකම් හා අනෙකුත් යහපත් දේ අතර සම්බන්ධය පාලනය කෙරෙන ප්‍රධාන මූලධර්ම කිහිපයකි. වයස 18ට අඩු පුද්ගලයන් අයිතිවාසිකම් සහිත අය ලෙස සැලකීම[13] දරුවාගේ උපරිම යහපත[14], දරුවාගේ වර්ධනය වන කුසලතා[15], වෙනස් කොට නොසැලකීම[16], හා සඵල බව ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය තත්ත්වයන් සුරක්ෂිත කිරීමේ වගකීම[17] ඒ අතර වෙයි.

ලිංගික අයිතිවාසිකම් පිළිබඳ සන්දර්භයේ දී, මෙම මූලධර්ම සඳහා අදාළ දරුවාගේ හා නව යෞවනයාගේ අවබෝධය, ක්‍රියාකාරකම්, මානසික හෝ ශාරීරික සෞඛ්‍ය තත්ත්වය, දෙමාපියන් හා අනෙකුත් සම්බන්ධිත පාර්ශව හා ඇති සම්බන්ධය, සම්බන්ධිත පිරිස හා පවතින බල සම්බන්ධයන් හා ආසන්න ගැටලුවේ ස්වභාවය ආදී වශයෙන් වූ සුවිශේෂී සන්දර්භයන් සලකා බැලෙන හා පරිණතභාවය විදහා දැක්වීම මගින් දැනුවත් වූ තනි පුද්ගල ප්‍රවේශයක් අවශ්‍ය ය.

### 3 වැනි මූලධර්ම:

IPPF අවබෝධ කර ගන්නා ආකාරයට සියලු මානව හිමිකම් ප්‍රවර්ධනයට හා ආරක්ෂා කිරීමට[18] වෙන් කොට නොසැලකීමේ ප්‍රතිපත්ති රාමුවක් අවශ්‍ය ය. මෙම වෙනස් කොට නොසැලකිමේ රාමුව විසින් ලිංගිකත්වය[19], වයස[20], ස්ත්‍රී පුරුෂ බව[21], ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව[22], ලිංගික දිශාභිමුඛ වීම[23], විවාහක අවිවාහක බව, ලිංගික ඉතිහාසය හෝ චර්යාවල අව්‍යාජ භාවය හෝ ව්‍යාජ භාවය, ජනවර්ගය, වර්ණය, ජාතිකත්වය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් අදහස්, ජාතික, භූගෝලීය හෝ සමාජීය තත්ව, දේපළ, උපත, ශාරීරික හෝ මානසික දුර්වලතා, සෞඛ්‍ය තත්ත්වය ( එච්.අයි.වී. ද ඇතුළත් ව), සිවිල් දේශපාලන හෝ වෙනත් තත්ත්ව, ආදී වශයෙන් වූ සියලු මානව අයිතීන් හා මූලික නිදහස දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික, සිවිල් හෝ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක දී අනෙකුත් අය සමඟ සම තත්ත්වයක

භුක්ති විඳීම හෝ ක්‍රියාවේ නැංවීම, හඳුනා ගැනීම නැති කරන හෝ බාදා කිරීමේ අරමුණ ඇති ඕනෑ ම තත්ත්වයක් තහනම් කරනු ලබයි.

ලිංගික අයිතීන් විෂයයෙහි වෙනස් ලෙස සැලකීම, ලිංගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගික අනන්‍යතාව, ලිංගික දිශාභිමුඛ වීම, විවාහක අවිවාහක බව ලිංගික ඉතිහාසය හෝ චර්යාවල ව්‍යාජ බව හෝ අව්‍යාජ බවල ලිංගික පුරුදු හෝ ලිංගික දිශාභිමුඛ වීම හේතු කොට ගෙන සංස්කෘතික, දේශපාලනික, ආර්ථික හෝ සමාජයීය අයිතීන්ට ඇති අසමාන ප්‍රවේශය, මෙන් ම පුද්ගලයෙකුට අන් අය හා සමානව අයිතීන් භුක්ති විඳීම සීමා කරවන ලිංගික සෞඛ්‍ය සේවා, පූර්ණ ලිංගික අධ්‍යාපනය හා ලිංගික හිංසනයෙන් මිදීමේ අයිතිය ආදී වශයෙන් වූ ලිංගික අයිතිවාසිකම් අහිමි කිරීම ආදී කරුණු මගින් ප්‍රකට වෙයි.

එක් එක් පුද්ගලයන් විසින් ඔවුන්ගේ ලිංගික අයිතීන් සපුරා ගැනීමේ දී විවිධ බාධක හඳුනා ගනු ලබයි. පූර්ණ සමානාත්මතාව සඳහා පුද්ගලයන්හට අනෙකුත් අය සමඟ සම මට්ටමකින් මූලික අයිතීන් හා නිදහස භුක්ති විඳීම සඳහා මෙම බාධක ඉවත් කිරීම අවශ්‍ය ය. මෙහි දී කොන් කිරීමට ලක් වූ හා ප්‍රමාණවත් ලෙස අවස්ථා නොලැබුණු කණ්ඩායම් සඳහා විශේෂ අවධානය යොමු කිරීම අවශ්‍ය වනු ඇත.

### 4 වැනි මූලධර්මය:

කෙනෙකු දරුවන් බිහි කිරීමට හෝ නො කිරීමට තීරණය කළ ද, ලිංගිකත්වය හා එයින් ජනනය වන සතුට, මිනිසත් බව පිළිබඳ වැදගත් ම අංගයකි. ලිංගික සෞඛ්‍යය ජීවිතය පුරා ම පැතිර පවතී. ලිංගිකත්වය සියලු ම ප්‍රජනක තීරණයන්හි මූලික කරුණකි. එමෙන් ම එය, කෙනෙකු දරුවන් බිහි කිරීම පිළිබඳ හෝ නොකිරීම සලකා බැලීම ද, මානවීය භාවය පිළිබඳ ප්‍රධානතම අංගයකි.

ලිංගිකත්වය යනු හුදෙක් පුද්ගලයන්ට සිය ප්‍රජනන අවශ්‍යතා සපුරා ගැනීමේ මාර්ගයක් පමණක් නො වේ. ප්‍රජනනයෙන් තොරව ලිංගිකත්වය ප්‍රකාශනයේ හා අත්විඳීමේ අයිතිය හා ලිංගිකත්වයෙන් තොරව ප්‍රජානනය අත්විඳීමේ අයිතිය ඓතිහාසික මෙන් ම වර්තමානයේ එබඳු අයිතියක් අත්නොවිඳි පිරිස පිළිබඳ ව විශේෂ අවධානය යොමු කරමින් ආරක්ෂා කළ යුතු ය.

සියලු දෙනා ම සතුටුදායක ලිංගිකත්වයක් ළඟා කර ගැනීමේ තත්ත්වයක් සඳහා හිමිකම් ලබති. සතුට පුද්ගල හා බැඳීම් පිළිබඳ ස්වාධිපත්‍යය මත රඳා පවතින අතර ඒ සඳහා ලිංගික අධ්‍යාපනය පිළිබඳ පොදු ප්‍රතිපත්ති තිබීම, සෞඛ්‍ය සේවා තිබීම, හිංසනයෙන් හා බලහත්කාරයේ නිදහස, මෙන් ම යුක්තිය පිළිබඳ කරුණුවල දී සදාචාරාත්මක විෂය පථයක් වර්ධනය වීම, සමානාත්මතාව හා ස්වාධීනත්වය තහවුරු කළ යුතුය. සතුට ලිංගිකත්වයේ නෛසර්ගික අංගයක් හේතුවෙන්, එය සොයා යාමේ, කුමන අවස්ථාවක එය අත්විඳින්නේ ද යන්න තීරණය කිරීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය කිසිදු පුද්ගලයකු වෙතින් උදුරා නොගත යුතු ය

**5 වැනි මූලධර්මය:**

සියලු දෙනා වෙත ලිංගික අයිතීන් සුරක්ෂිත කිරීමට නිදහස සඳහා වන කැපවීම මෙන් ම හිංසනයෙන් ආරක්ෂා වීම ද ඇතුළත් ය.

සියලු ආකාරයේ හිරිහැරවලින් හා ප්‍රචණ්ඩත්වයට එරෙහි උපයෝජනය හා ආරක්ෂා වීමේ අයිතිය ලිංගික අයිතීන් විසින් තහවුරු කරනු ලබයි[26]. ලිංගිකත්වය සම්බන්ධ හිරිහැර කිරීම් විෂයයෙහි ශාරීරික, වාචික, මානසික, ආර්ථික හා ලිංගික ස්වභාවය පිළිබඳ සියලු ආකාරයේ අපයෝජනය හා හිංසනය මෙන්ම පුද්ගලයන්ගේ ලිංගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂ බව, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව, ලිංගික දිශානතිය, විවාහක අවිවාහක බව, ලිංගික ඉතිහාසය හෝ චර්යාව, ව්‍යාජ හෝ අව්‍යාජ, ලිංගික පුරුදු හා ලිංගිකත්වය ප්‍රකාශ කිරීමේ ආකාරය ආදී වශයෙන් වූ කරුණු අඩංගු වෙයි.

සියලු දරුවෝ හා නව යෞවනයෝ[27] සියලු ආකාරයේ සූරාකෑම්වලින් ආරක්ෂා වීමේ විශේෂ අයිතිය භුක්ති විඳීමේ හිමිකම ලබති. එහිදී, ලිංගික සූරාකෑමෙන්, ළමා ගණිකා වෘත්තියෙන් හා සියලු ආකාරයේ ලිංගික අපයෝජනයෙන්, දරුවකුට කුමන ආකාරයක හෝ ලිංගික කාර්යයක යෙදීමට බල කිරීම හා දරුවන් අසභ්‍ය දර්ශන සහ ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීම ඇතුළු හිංසනය හා හිරිහැරවලින් ආරක්ෂා වීම අයත් වෙයි.

**6 වන මූලධර්මය:**

ලිංගික අයිතීන්හි විෂය පථය වනුයේ අන්‍යයන්ගේ අයිතීන් හා නිදහස නිසි පරිදි ආරක්ෂා කිරීමට එයට නිසි ස්ථානය සහතික කිරීමක්, ප්‍රජාතාන්ත්‍රික සමාජයේ පොදු යහපත සඳහා නීතිය මගින් නිර්ණය කර ඇති සීමාවන්ට අනුකූලවත් පමණි.

මානව හිමිකම් නීතිය අනුව[28] අනෙකුත් මානව හිමිකම් මෙන් ම ලිංගික අයිතීන් විෂය වනුයේ ප්‍රජාතන්ත්‍රික සමාජයේ පොදු යහපත හා අන්‍යයන්ගේ අයිතීන් හා නිදහස කෙරෙහි ගෞරවය හා පිළිගැනීම ආරක්ෂා කිරීම[29], පොදු සෞඛ්‍යය හා පොදු පැවැත්ම සහතික කිරීම සඳහා නීතිය මගින් නිර්ණය කර ඇති සීමාවන්ට පමණි. එම සීමා වෙනස් කොට නොසලකන සුලු අත්‍යවශ්‍ය යුක්ති යුක්ත අරමුණක් ළඟා කර ගැනීම සඳහා සකස් වූවක් විය යුතු ය. ලිංගික අයිතීන් ක්‍රියාවේ යෙදවීම, පෞද්ගලික හා සමාජ අරමුණුවල ගතික සබඳතාව පිළිබඳ අවබෝධය, දර්ශනයන්හි බහුවිධ බව පිළිබඳ පැවැත්ම හඳුනා ගැනීම සමානාත්මතාව, ගෞරවය, දර්ශනයන්හි බහුවිධබව පැවැත්ම පිළිබඳ හඳුනා ගැනීම හා සමානාත්මතාව, ගෞරවය හා වෙනස්කම් පිළිබඳ ගරු කිරීම සහතික කිරීමේ අවශ්‍යතාව[30] යන කරුණු මත පදනම් විය යුතු ය.

## 7 වන මූලධර්මය:

සියලු ලිංගික අයිතීන් හා නිදහසට ගරු කිරීම, ආරක්ෂා කිරීම හා සම්පූර්ණ කිරීම සඳහා වන බැඳීමට අයත් වේ.

ලිංගික අයිතීන් හා නිදහස විෂයයෙහි මූලික නීතිමය අවශ්‍යතා හා එම අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාමාර්ග සඳහා වන මාර්ග ද[31] ඇතුළත් වෙයි. අනෙකුත් මානව අයිතීන් මෙන්ම රාජ්‍යයන් කෙරෙහි ස්ථර තුනක සියලු දෙනාගේ ලිංගික අයිතීන්ට ගරු කිරීමට, ආරක්ෂා කිරීමට හා ඒවා සපුරා ගැනීමට[32] වගකීම් ඇත.

ගරු කිරීම සඳහා වන වගකීම යනු රාජ්‍යයන් යම්කිසි අයිතියක්, එනම්, ලිංගික අයිතීන් වින්දනය කිරීම සඳහා ඇති අයිතියට ඍජු හෝ වක්‍ර ආකාරයෙන් බලපෑම් කිරීමෙන් වැලකීම ය. ආරක්ෂා කිරීම සඳහා ඇති වගකීමේ දී, රාජ්‍යයන් විසින් තුන්වන පාර්ශවයන් මානව අයිතිවාසිකම් සහතික කිරීම කෙරෙහි බලපෑම් කිරීම වැලැක්වීමේ පියවර ගනු ලැබීම අවශ්‍ය වේ. සපුරා ගැනීමේ වගකීමට, රාජ්‍යය විසින් අයිතියේ පූර්ණ සපුරා ගැනීම සඳහා[33] සුදුසු ව්‍යවස්ථාදායක, පරිපාලනමය, මුදල්මය, ප්‍රවර්ධනාත්මක සහ අනෙකුත් අවශ්‍යතා සපුරනු ලැබීම අයත් වේ.

රාජ්‍යය සිය දේශසීමා තුළ මානව අයිතීන් ගරු කිරීම, ආරක්ෂා කිරීම හා සපුරා ගැනීම පිළිබඳ මූලික වගකීම් ධාරකයා වන අතර ම සිය ක්‍රියාවලිය මගින් ලිංගික අයිතීන් වින්දනය

කිරීම පිළිබඳව බලපෑමක් ඇති සිවිල් සමාජයේ අනෙකුත් ක්‍රියාකාරිකයන් ද මේ සම්බන්ධයෙන් වගකිව යුතු ය. මේ ක්‍රියාකාරිකයන් අතරට අනෙකුත් රාජ්‍ය, දේශ සීමාන්තර සංවිධාන, ආධාර හා සංවර්ධන සහාය සපයන ව්‍යාපෘති, ආරක්ෂක සැලසුම් හා අනෙකුත් සම්බන්ධිත ව්‍යාපෘති මෙන්ම වාණිජමය, ලාභ නොලබන හා ආගමික ආදී වශයෙන් වූ රාජ්‍ය නොවන අංශ හා තනි පුද්ගලයන් ද ඇතුළත් වේ.

මේ හේතුවෙන් රාජ්‍ය, පුද්ගලයකුගේ ලිංගික අයිතීන් උල්ලංඝනය කිරීමෙන් හෝ බලපෑම් කිරීමෙන් වැලකී සිටිය යුතුය, තුන්වන පාර්ශවයන් මගින් එම අයිතීන් උල්ලංඝනය හා බලපෑම් කිරීමෙන් ආරක්ෂා කළ යුතු අතර ලිංගික අයිතීන් සාක්ෂාත් කර ගැනීම සඳහා වූ සම්පත් වෙන් කිරීම හා ඵලදායී සහභාගිත්ව ආයතන ගොඩනැංවීම ඇතුළු සාධනීය ක්‍රියාමාර්ග ගත යුතු ය. IPPF සිය ශක්‍යතා රාමුව තුළ හිඳිමින් මතු දක්වෙන ලිංගික අයිතීන් ගරු කිරීම, ආරක්ෂා කිරීම හා සපුරාලීම සඳහා වන භූමිකාවේ මනා ලෙස නියැලීමට සියලු සාමාජික සංවිධාන දිරිමත් කිරීමට හා රාජ්‍යයන්ට සිය ව්‍යවස්ථාදායක, පරිපාලන, මූල්‍යමය හා අනෙකුත් ප්‍රතිපත්තීන් ඵල හා ක්‍රියාකාරකම් තුළ සියලු හිමිකම් ගරු කිරීම, ආරක්ෂා කිරීම හා සපුරාලීම සඳහා උපදෙස් ලබා දීම් සිදු කරනු ලබයි.

## ලිංගික අයිතීන් ලිංගිකත්වය හා බැඳුණු මානව අයිතීන් ය.

IPPF විසින් ලිංගික අයිතීන් යනු මානව අයිතීන් බව තහවුරු කරයි. ලිංගික අයිතීන් සකස් වී ඇත්තේ සියලු දෙනාගේ නිදහසට, සමානාත්මතාවට, පෞද්ගලිකත්වයට, ස්වාධිපත්‍යයට, පූර්ණත්වයට හා ගෞරවයට ඇති අයිතීන්වලින් ජනිත වන්නා වූ ලිංගිකත්වයට අදාළ හිමිකම් සමූහයක් මගිනි. බොහෝ අන්තර්ජාතික මෙවලම්, උපමාන හා ප්‍රමිතීන් ලිංගිකත්වයට අදාළ මූලධර්ම හඳුනා ගනියි. ලිංගික අයිතීන් යනු පවත්නා මානව හිමිකම් ලිංගිකත්වයට අදාළ කළ විට මතුව එන සුවිශේෂී උපමානයක් වේ. ලිංගික අයිතීන් යම් යම් අනන්‍යතා ආරක්ෂා කරන අතර ම ඉන් ඔබ්බට ගොස් අනෙකුත් අයගේ අයිතීන්ට ගරු කරමින් හා වෙනස්කම් නොකිරීමේ රාමුවක් තුළ සියලු දෙනාගේ ලිංගිකත්වය ප්‍රකාශ කිරීමේ හා සපුරා ගැනීමේ අවස්ථා ලබා ගැනීමේ අයිතිය ආරක්ෂා කරනු ලබයි.

මතු දැක්වෙන ලිංගික අයිතීන් මූලික හා හොඳින් ස්ථාපිත මානව අයිතිවාසිකම් මූලධර්ම මානව ලිංගිකත්ව විෂය පථයට අදාළ කරයි. ඒවායේ අදාළත්වය දිළිඳු, කොන් කරනු

ලැබූ, සමාජයීය වශයෙන් වෙන් කරනු ලැබූ හා ඌන සේවාලාභීන්හට විශේෂ වැදගත්කමක් උසුලයි.

IPPF විශ්වීය බව, සහසම්බන්ධතාව, එකිනෙකා මත යැපීම, වෙන් කළ නොහැකි බව තහවුරු කරන හෙයින් මෙම ප්‍රකාශනයෙහි මතු දැක්වෙන ලිංගික අයිතිවාසිකම් අඩංගු කර ඇති ආකාරයෙහි කිසිදු අනුපිළිවෙළ සුවිශේෂී බවක් නොදක්වයි. මතු දැක්වෙන වගන්ති ක්‍රියාවේ යෙදවීම ඒවාට මුලින් ඇති පොදු මූලධර්ම මගින් දැනුවත් විය යුතු ය.

**වගන්තිය 1 :** සමානාත්මතාවට, නීතිය මගින් සමාන ව ආරක්ෂාව ලැබීමට හා ලිංගිකත්වය, ලිංගිකතාව හෝ ස්ත්‍රී පුරුෂ බව මත පදනම් ව කෙරෙන සියලු ආකාරයේ වෙනස්කම්වලින් නිදහස සඳහා ඇති අයිතිය.

සියලු මනුෂ්‍යයෝ උපතින් ම නිදහස් හා ගෞරවය හා අයිතිවාසිකම් අතින් සමාන වන අතර[34] නීතිය මගින්[35] ඔවුන්ගේ ලිංගිකතාව, ලිංගිකත්වය හෝ ස්ත්‍රී පුරුෂ බව මත පදනම්[36] වෙනස් කොට සැලකීමට එරෙහි ව සමාන ආරක්ෂාවක් භුක්ති විඳිති.

- සියල්ලන් හට රජය මගින් දරනු ලබන පූර්ණ අයිතීන්ට සමාන ප්‍රවේශයක් ඇති, එසේ ම ඒවා භුක්ති විඳින පරිසරයක් තහවුරු කරනු ලැබිය යුතු ය. රාජ්‍යය හා සිවිල් සමාජය පිරිමින්ගේ හා කාන්තාවන්ගේ සාම්ප්‍රදායික භූමිකාව හෝ ලිංගිකත්වයන්, ස්ත්‍රී පුරුෂ බව හෝ ස්ත්‍රී පුරුෂ බවේ ප්‍රකාශනවල උසස් බව හෝ පහත් බව පිළිබඳ අදහස මත පදනම් වූ සමාජ හා සංස්කෘතික පුරුදු වෙනස් කිරීම ප්‍රවර්ධනය සඳහා පියවර ගත යුතු ය.
- සියල්ලන් හට අධ්‍යාපනයට, සෞඛ්‍යයට, සමාජ ආරක්ෂණයට හා අනෙකුත් ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතීන් සඳහා මෙන් ම ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ, සේවා පහසුකම් හා තත්ත්වයන් කිසිදු ලෙසකින්වත් වෙනස්කමකට භාජනය නොවෙමින් ලබා ගැනීම සඳහා අයිතියක් ඇත.
- සියලු දෙනා හට නීතිමය හැකියාව හා එය ක්‍රියාවේ යෙදවීම සමාන අවස්ථා, ගිවිසුම්වලට එළඹීමට හා දේපල පාලනයට සමාන අයිතීන් තිබිය යුතු අතර දරුවන්ගේ හැකියාවන් වර්ධනය පිළිබඳ නියමිත සැලකිල්ල යොමු කරමින් සියලු දෙනා

අධිකරණයේ හා විනිශ්චය සභාවන්වල පටිපාටීන්හි සියලු අවස්ථාවල දී සමාන ලෙස සලකනු ලැබිය යුතු ය.

- සියලු දෙනා හට සංචලනය පිළිබඳ හා පදිංචිය හා වාසස්ථානය තෝරා ගැනීම පිළිබඳ නීතිය වෙනස් කොට සැලකීමකින් තොර ව සමාන අයිතීන් තිබිය යුතු ය.

**වගන්තිය 2** : ලිංගිත්වය, ලිංගිකතාව හෝ ස්ත්‍රී පුරුෂ බව පිළිබඳ හෝ වෙනසකින් තොරව සියලු දෙනා හට ම සහභාගිත්වය පිළිබඳ අයිතිය.

සියලු පුද්ගලයෝ මානව ජීවිතයේ සිවිල්, ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනික අංග විෂයයෙහි ප්‍රාදේශීය, ජාතික කලාපීය හා අන්තර්ජාතික මට්ටම්වල දී ක්‍රියාකාරී, නිදහස් හා අර්ථාන්විත සහභාගිත්වයක් සඳහා හිමිකම ලබන අතර එමගින් මානව හිමිකම් හා මූලික නිදහස ළඟා කර ගත හැකි ය.[37]

- සියලු දෙනා හට ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය ඇතුළු ව සිය සුභසාධනය[38] තහවුරු කෙරෙන ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ අයිතිය ලබන අතර එහිදී ස්ත්‍රී පුරුෂ බව හෝ ලිංගිකත්ව සාධකය මත වූ අදහස් හේතුවෙන් සහභාගිත්වය වලක්වන හෝ වෙන් කොට තබන පූර්ව නිගමන සාම්ප්‍රදායික මත, ස්ත්‍රී පුරුෂ බව පිළිබඳ වෙනස් කොට සැලකීමේ උපමානයන් හෝ විවාහක අවිවාහක බව. එච්. අයි. වී. තත්ත්වයන්[39] වැනි හෝ එසේ නොවන බාධක නොපැවතිය යුතු ය.
- නිරන්තර වෙන් කොට තැබීමට භාජනය වන බාලවයස්කරුවෝ සිය සමාජයන්හි වෙනස්වීම් පිළිබඳ ක්‍රියාවලියේ සහභාගිවන්නන් හා ප්‍රධාන භූමිකා දරන්නන් බවට පත් වෙති. ඔවුනට සහභාගිත්වය සඳහා ආර්ථාන්විත විධික්‍රම පවතින අතර ලිංගික හා ප්‍රජානන සෞඛ්‍යය[40] හා අයිතීන් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය හා සපුරා ගැනීම සඳහා වන ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවර්ධනයේ දී වගකීම් දරනු ලැබිය යුතු ය.
- සියලු දෙනා ම කිසිදු ආකාරයක වෙනස් කිරීමකට භාජනය වීමෙන් තොර ව තනතුරු දැරීම, පොදු ක්‍රියාකාරකම්වල නිරත වීම ඇතුළු පොදු හා දේශපාලන ජීවිතයේ දී සහභාගි වීමේ හැකියාව ලබති.
- සහභාගිත්වයේ මූලික අංගයක් වශයෙන් සියලු දෙනා හට වෙනස් කොට සැලකීමකින් තොර ව සංචරණය සඳහා හා සිය රටින් බැහැර යාමට හා නැවත ඒමට මෙන් ම

සංවරණය සඳහා උපකාරී වන ලිපි ලේඛන සඳහා ඇති සමාන ප්‍රවේශය ද සඳහා පවතින අයිතිය භුක්ති විඳිය හැකි ය [41.]

**වගන්තිය 3:** ජීවිතයට, නිදහසට, පෞද්ගලික ආරක්ෂාවට හා ශාරීරික ඒකාග්‍රතාවට ඇති අයිතිය.

සියලු දෙනා හට සියලු අවස්ථාවල දී මෙන්ම විශේෂයෙන් වෙනස් කොට සැලකීම පිළිබඳ යම් ආකාරයක තහනම් කරනු ලැබූ අවස්ථාවක දී ජීවිතයට, නිදහසට අයිතිය[42] මෙන් ම කෲර, අමානුෂික හා අපහසාත්මක සැලකුම්වලින් නිදහස් ව හිඳීමේ[43] අයිතිය ලබන අතර ප්‍රචණ්ඩත්වයෙන් හෝ බලකිරීමෙන් තොරව සිය ලිංගිකත්වය ක්‍රියාවේ යෙදවීමේ අයිතිය ද ඇත.

- සියලු දෙනා හට ජීවිතයට හා ශාරීරික ඒකාග්‍රතාව සඳහා[44] අයිතියක් ඇත. මෙම අයිතීන් පවුලක ගෞරවය. කෙලසීම පිණිස[45] අනතුරට හෙළීම හෝ තර්ජනයක් ලෙස භාවිත කිරීම නොකළ යුතු ය.
- කිසිදු පුද්ගලයකු තෛතික හෝ මරණයකට හෝ නෛතික හෝ ශාරීරික දඬුවමකට සිය ලිංගික චර්යාව හෝ ඉතිහාසය, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව හෝ ප්‍රකාශනය46 හේතුවෙන් යමක් නොකළ යුතු ය.
- කිසිදු කාන්තාවකගේ ජීවිතය, යම් ආකාරයක කායික හෝ මානසික තත්ත්වයක් හේතුවෙන් වෛද්‍ය ප්‍රතිකාර ප්‍රතික්ෂේප වීමකින් හෝ ඇය දරන්නා වූ කළලය පිළිබඳ වෙනත් අය විසින් කරනු ලබන්නා වූ අගය කිරීම් හේතුවෙන් හෝ අනතුරට ලක් නොකළ යුතු ය.
- කිසිදු කාන්තාවකට සිය ලිංගිකත්වය ක්‍රියාවේ යෙදවීමේ ඵලයක් වශයෙන් බලහත්කාරයෙන් මාතෘත්වයට දැරීමට යොමු නොකළ යුතු ය.
- සියලු දෙනා හට ස්ත්‍රී ලිංගච්ඡේදනය හා බාලවයස්කාර විවාහය[47] වැනි අන්තරායකාරී සාම්ප්‍රදායික සිරිත්වලින් නිදහස් ව සිටීමේ අයිතිය ඇත.
- සියලු දෙනා හට විවාහය තුළ, විවාහයට බාහිරව ගැටුම් පවතින විට හෝ රඳවා තබා ගන්නා අවස්ථාවල දී සියලු ආකාරයේ ශාරීරික, වාචික, මානසික හෝ ආර්ථික අපයෝජනයන්, ලිංගික හිරිහැර හෝ ලිංගික ප්‍රචණ්ඩත්වය, දූෂණය හා වෙනත් ආකාරයේ ලිංගික බලහත්කාරකම් ඇතුළු ප්‍රචණ්ඩත්වයෙන් තොර ව හිඳීමේ අයිතිය ඇත.

- සියලු ලිංගයන්ට අයත් ලිංගික ශ්‍රමිකයන්[48] ඇතුළුව සියලු දෙනාහට නියමාකාරයේ හෝ විවාහයට බාහිර අනියම් ආකාරයේ ලිංගික ක්‍රියාකාරකම්වල දී අපකීර්තිය හෝ ඔවුන්ගේ, ලිංගිකත්වය හෝ ස්ත්‍රී පුරුෂ බව පිළිබඳ වෙනස්කම් මත ප්‍රචණ්ඩත්වයට ලක් නොවීමේ නිදහස ඇත.
- කිසිදු අයෙකු එකඟත්වය ඇතිව සිදුවන ලිංගික ක්‍රියා[49] සම්බන්ධයෙන් නිරවද්‍ය නොවූ සාවද්‍ය නිර්වචන අපරාධ විධිවිධාන සම්බන්ධ ව අත්තනෝමතික ව රඳවා ගැනීමක, අත්තනෝමතික හෝ වෙනස් කොට සැලකෙන තහංචියකට හෝ ලක් නොකළ යුතු ය.
- කිසිදු පුද්ගලයෙකුගේ නියම හෝ ආරෝපිත ලිංගික ක්‍රියා පුරුදු ඇතුළත් ව ලිංගික තෝරා ගැනීම් පුරුදු හෝ ප්‍රකාශයන් හේතුවෙන් ප්‍රචණ්ඩත්වය අපහරණය හෝ හිරිහැර[50] සඳහා වන දඬුවම් අඩු කිරීම, දඬුවම්වලට සමාව දීම හෝ එසේ කිරීම සාධාරණීකරණය කිරීම හෝ නොකළ යුතු ය.
- සියලු සංක්‍රමණිකයන් හා සංක්‍රමණික සේවකයන්, විශේෂයෙන් ලාබාල, ස්ත්‍රී හා ලිංගාතර සංක්‍රමණිකයන් ඔවුන් සේවය කරන හෝ ජීවත් වන රටේ දී ඔවුන්ගේ ලිංගික හා ලිංග ප්‍රකාශනය මත පදනම් වන ශාරීරික හිංසනයෙන් හා ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා වීමට මෙන්ම ඔවුනගේ ලිංගික සෞඛ්‍ය ආරක්ෂා කිරීමට හා ලිංගික අයිතීන් සපුරා ගැනීමට අවකාශ තිබිය යුතු ය.
- සියලු දෙනා හට රාජ්‍යයේ ක්‍රියා පිළිවෙතක් හේතුවෙන් ඇති වන හෝ පුද්ගලයකු දරුණු ගණයේ අපයෝජනයාගේ[51] ගලවා ගැනීමට පියවර ගැනීමට අපොහොසත් වීම ආදී වශයෙන් වන ලිංගත්වය, ලිංගිකත්වය, ලිංගික අනන්‍යතාව, ලිංගික ඉතිහාසය හෝ හැසිරීම හෝ ලිංගික දිශානතියේ හෝ එච්.අයි.වී.[52] තත්ත්වයන් ආදී කවර කරුණක් මත හෝ පිහිටා ඇති වන හිංසනයෙන් ආරක්ෂා සෙවීමේ අයිතිය ඇත.

## වගන්තිය 4

සියලු පුද්ගලයන්ගේ ම සිය පෞද්ගලිකත්වය, පවුල, නිවස, ලියකියවිලි හෝ ලිපි ගනුදෙනු[54] ආදියට අත්තනෝමතික ලෙස මැදිහත්වීමෙන් වැළකීමේ අයිතිය හා ලිංගික ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය පෞද්ගලිකත්වයේ අයිතිය ඇත.

- සියලු දෙනා ලිංගික ස්වාධීනත්වය සඳහා අයිතිය ඇති අතර ඔවුන්ගේ ලිංගිකත්වය, ලිංගික චර්යාව හා සමීප ආදිතයා පිළිබඳ තීරණ ගැනීමට හැකිය.

- සියලු දෙනා හට ලිංගික සෞඛ්‍ය සේවා පිළිබඳ, වෛද්‍ය වාර්තා පිළිබඳ ව හා පොදුවේ ඔවුනගේ එච්.අයි.වී. තත්ත්වයන් පිළිබඳ ව රහස්‍යභාවය පවත්වා ගැනීමේ අයිතිය මෙන්ම වෙන් කොට සැලකීමකින් තොර ව[55] හා ඉඩ ඇති සීමාවන් සහිත රාමුවක හිඳ අත්තනෝමතික හෙළිදරව් කිරීම් හෝ එබඳු හෙළිකිරීම් පිළිබඳ තර්ජනයෙන් ගැලවීමේ අයිතිය ද ඇත.
- සියලු දෙනා හට සිය ලිංගික තෝරා ගැනීම්, ලිංගික ඉතිහාසය, ලිංගික සහකරුවන් හා චර්යාවන් හා අනෙකුත් ලිංගිකත්වයට අදාළ කරුණු පිළිබඳ ව හෙළිදරව් කිරීම පාලනය කිරීමේ අයිතිය ඇත.

## වගන්තිය 5

සියල්ලන් හට නීතිය ඉදිරියේ පිළිගනු ලැබීමට හා ලිංගික නිදහසට අයිතියක් ඇති අතර එයට පුද්ගලයන් හට ලිංගිකත්වය හා සබැඳි කරුණු විෂයෙහි නිදහසේ තීරණ ගැනීමට හා ඒවා පාලනයට ඇති නිදහස, සිය ලිංගික සහකරු තෝරා ගැනීමේ නිදහස, සිය උපරිම ලිංගික හැකියාව හා සතුට අත්දැකීම සඳහා ඇති නිදහස ඇතුළත් අතර ඒවා වෙනස් කොට නොසැලකීමේ රාමුවක් තුළ අනෙක් අයගේ අයිතීන්ට හා ළමයින්ගේ වර්ධනය වන ශක්‍යතාවන්ට ගරු කිරීම තුළ විය යුතු ය.

- සෑම අයෙකුට ම කිසිදු වෙනස්කමකට භාජනය නොවී සෑම ස්ථානයක ම නීතිය ඉදිරියේ පිළිගැනීමට භාජනය වීමේ අයිතිය ඇත.
- සියලු දෙනාට වෙනස් කොට සැලකීමකින්, හිංසනයෙන් හෝ බලකිරීමෙන් තොර ව සියලු අයිතීන් හා නිදහස සැමට සම ව විඳගත හැකි සමාජ ආර්ථික හා දේශපාලන තත්ත්වයන් සහිත පරිසරයක් තුළ ස්වාධීන හා සබඳතාමය ලිංගික ක්‍රියාකාරකම් හා හැසිරීම් ක්‍රියාවේ යෙදවීමේ නිදහස ඇත.
- කිසිදු පුද්ගලයෙකු අනුමැතියෙන් ඇති වූ ලිංගික සබඳතා අත්තනෝමතික ලෙස වරදක් ලෙස සලකන නීති මගින් වරදකරු නොකළ යුතු අතර ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, ලිංගිකත්වය හෝ අනුමැතියෙන් ඇති වූ ලිංගික කටයුතු හෝ හැසිරීම් පදනම් ව අත්අඩංගුවට නොගත යුතු ය.
- අත් අඩංගුවේ පසුවන සියලු දෙනා හට කිසිදු තහනම් කරන ලද වෙනස් කොට සැලකීමේ තත්වයක පිහිටා සිදුවන හිරිහැර කිරීමේ අවදානමට හෝ අපයෝජනයට ලක් නොවීමේ අයිතිය ඇත. අත්අඩංගුවේ පසුවන සෑම දෙනාහට ම කොන් කරනු ලැබීමෙන්[57]

ආරක්ෂා වීමේ අයිතිය මෙන්ම නිරතුරු ව බිරිඳ හෝ සැමියා විසින් පැමිණ මුණ ගැසෙනු ලැබීමේ අයිතිය ද[58] ඇත.

- සියලු පුද්ගලයන් හට[58] අපරාධය මගින් ඇති වන හිංසනයෙන් නිදහස් වීමේ අයිතිය ඇත.
- කිසිදු පුද්ගලයකු ස්වකීය කැමැත්තෙන් තොර ව වෛද්‍ය පර්යේෂණයකට හෝ ක්‍රියාදාමයකට භාජනය නොකළ යුතු ය. කිසිදු පුද්ගලයකු ආරක්ෂිත ලිංගික ප්‍රකාශයක්, ලිංගික දිශානතියක්, ලිංගික ඉතිහාසයක් හෝ චර්යාවක්, නියම හෝ අනියම් ලිංගික අනන්‍යතාවක් හෝ ප්‍රකාශනයක් හෝ මත පදනම් ව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කිරීම හෝ අන්තනෝමතික වෛද්‍යමය සීමා කිරීමට භාජනය නොකළ යුතු ය.
- කිසිදු පුද්ගලයකු සිය ලිංග අනන්‍යතාව තහවුරු කිරීමේ නෛතික අවශ්‍යතාවක් වශයෙන් වන්ධ්‍යකරණය, හෝමෝන ප්‍රතිකර්මය හෝ ලිංගිකත්වය ප්‍රතිනිර්මාණය කිරීමේ සැත්කම හෝ වශයෙන් කිසිදු වෛද්‍යමය ක්‍රියාවලියකට භාජනය වීමට බලපෑම් නොකළ යුතු ය. එමෙන් ම සිය ලිංගිකත්වය, වයස, ලිංගික අනන්‍යතාව හෝ ලිංගික දිශානතිය සඟවා ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට බලපෑම් නොකළ යුතු ය.
- කිසිදු පුද්ගලයකු සිය ස්වයං නිර්ණය කරන ලද ලිංගික අනන්‍යතාව උප්පැන්න සහතිකය, ගමන් බලපත්‍රය, මැතිවරණ ලේඛන ආදිය ඇතුළත් වන හා ඒවාට පමණක් සීමා නොවන අනන්‍යතා ලේඛනවල ඇතුළත් කිරීමෙන් වැලැක්වීම නොකළ යුතු ය.

## වගන්තිය 6

සිතිවිල්ලේ නිදහසට, අදහස් දැරීමේ හා ප්‍රකාශ කිරීමේ නිදහසට හා ආශ්‍රය සඳහා ඇති නිදහස

සියලු දෙනා විෂයෙහි මහජන ආරක්ෂාව හෝ මහජන සෞඛ්‍යය, පොදු ගුණධර්ම, මහජන පැවැත්ම ආදී වෙනස් කොට සැලකෙන සංකල්ප හෝ කැපී පෙනෙන සංස්කෘතිකමය විශ්වාස හෝ දේශපාලන දර්ශන මත පදනම් වූ අත්තනෝමතික සීමා හෝ මැදිහත්වීම්වලින් තොර ව ලිංගිකත්වය, ලිංගික දිශානතිය, ලිංගික අනන්‍යතාව හා ලිංගික අයිතීන් පිළිබඳ සිහිවිල්ලේ නිදහස, අදහස් දැරීමේ හා ප්‍රකාශ කිරීමේ නිදහස තිබිය යුතු ය.[59]

- සියලු දෙනා හට වෙනස් කොට නොසැලකීමේ හා දරුවන්ගේ වර්ධනය වන ශක්‍යතා කෙරෙහි ගරු කිරීමේ රාමුවක් තුළ බලපෑම් කරනු ලැබීමකින් තොරව අදහස් දැරීමේ

අයිතිය ඇතුළු ව සිතිවිල්ලේ නිදහස, හෘද සාක්ෂියේ නිදහස හා ආගමික නිදහස[60] තිබිය යුතු ය.

- සියලු දෙනා හට, විශේෂයෙන් ම කාන්තාවන් හට සීමා කිරීමකින් තොර ව[61] සිය අනන්‍යතාව හෝ පුද්ගල බව ... හැසිරීම, ඇඳුම, ශාරීරික අංගලක්ෂණ, නම තෝරා ගැනීම, සහ අනෙකුත් මාර්ගයන්ගෙන් ප්‍රකාශ කිරීමට අයිතිය ඇත.
- සියලු දෙනා හට අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා දරුවන්ගේ වර්ධනය වන ශක්‍යතාව සලකමින් වෙන් කොට නොසලකන රාමුවක් තුළ දේශසීමා නොසලකා ඕනෑම නීත්‍යානුකූල මාධ්‍යයක් මගින් මානව හිමිකම්, ලිංගික අයිතීන්, ලිංගික දිශානතිය, ලියා අනන්‍යතාව හා ලිංගිකත්වය පිළිබඳ ලබා ගැනීමට, සෙවීමට හා බෙදා ගැනීමට අයිතිය ඇත.
- සියලු දෙනාහට විවිධාකාරයෙන් සාමකාමී රැස්වීමේ හා ඇසුරු කිරීමේ[62] නිදහස ඇත. මෙයට කණ්ඩායම් හා සංවිධාන ඇති කිරීමේ, සාමාජික වීමේ හා ස්ථාපිත කිරීමේ අයිතිය මෙන්ම සියලු දෙනාගේ ම අයිතීන් හා නිදහස පූර්ණ වශයෙන් ස්ථාපිත කෙරෙන සමාජ පැවැත්මක් සහිත රාමුවක් තුළ මානව හිමිකම්, ලිංගික අයිතීන්, ලිංගික දිශානතිය, ලිංග අනන්‍යතාව, ලිංගිකත්වය පිළිබඳ ගැටලු පිළිබඳ අදහස් හා තොරතුරු ඕනෑ ම මාධ්‍යයක් මගින් සංවර්ධනය කිරීමේ, හුවමාරු කර ගැනීමේ හා බෙදාහැරීමේ අයිතිය ඇත.

## වගන්තිය 7

සෞඛ්‍යය සඳහා හා විද්‍යාත්මක දියුණුවේ ප්‍රතිඵල සඳහා වන අයිතිය.

සියලු දෙනා හට ශාරීරික හා මානසික සෞඛ්‍යයේ[63] ළඟාවිය හැකි ඉහළ ම තත්ත්වයන් භුක්ති විඳීමේ අයිතිය ඇත. මෙහිදී සෞඛ්‍යයට හේතු පාදක වනතුරු[64] හා රෝග වැළැක්වීම සඳහා ලිංගික සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම සියලු ලිංගික ගැටලු හඳුනා ගැනීම හා ප්‍රතිකාර කිරීම ඇතුළත් ය.

- සියලු දෙනා හට අනවශ්‍ය ගර්භනීභාවය වළක්වා ගැනීමට හා එච්.අයි.වී. ඒඩ්ස් ඇතුළු සියලු ආකාරයේ ලිංගික ව සම්ප්‍රේෂණය වන රෝග වළක්වා ගැනීම සඳහා ආරක්ෂිත ලිංගික ඇසුර ලබා ගැනීමේ අයිතිය ඇත.
- සියලු දෙනා හට තමන් ජීවත් වන ජන සමාජයේ පොදු සෞඛ්‍යය පිළිබඳ ව වන නීති, ප්‍රතිපත්ති හා වැඩසටහන් ස්ථාපනය කිරීමට සහභාගි වීමේ අයිතිය ඇත.

- සියලු සෞඛ්‍යමය මැදිහත්වීම් කොන් කරන ලද පුද්ගලයන් හා ජන කොටස්වල අවශ්‍යතාවන්ට ද සංවේදී විය යුතු ය.
- සියලු පුද්ගලයන් හට සෞඛ්‍ය හා සේවා සඳහා සෞඛ්‍ය සේවා සපයන්නන්ගේ හෘදසාක්ෂියේ විරෝධයෙන්[65] නිදහස් වූ ප්‍රවේශයක් තිබිය යුතු ය.
- සියලු දෙනා හට සෞඛ්‍යය විෂයයෙහි ලිංගික අයිතිවාසිකම්, ලිංගික දිශානතිය, ලිංගිකත්වය හා ලිංග අනන්‍යතාව පිළිබඳ තොරතුරුවලට පිවිසීමේ අයිතිය ඇති අතර විද්‍යාත්මක වලංගු පර්යේෂණ හා සාක්ෂි වන පදනම් වූ වඩාත් යෝග්‍ය සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේ අයිතිය ද ඇත. ලිංගික ශ්‍රමිකයන් ද ඇතුළත් ව සියලු දෙනාහට ආරක්ෂිත සේවා තත්ත්වයන්, සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීම, සහකරුවන් හා ගනුදෙනුකරුවන් හා ආරක්ෂිත ලිංගික ඇසුර ඉල්ලා සිටීමට අවශ්‍ය සහයෝගය හා ආරක්ෂාව ලැබීමේ අයිතිය ඇත.
- අවිගැටුම්වලට මැදි වූ හා බලහත්කාරයෙන් එක්තැන් වීමට ලක් වූ සියලු පුද්ගලයන් හට පූර්ණ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමේ අයිතිය ඇත.
- සියලු දෙනා හට විද්‍යාත්මක දියුණුවේ හා එහි ප්‍රායෝගික යොදා ගැනීම්[66] ලිංගික අයිතිවාසිකම් හා ලිංගික සෞඛ්‍යය විෂයයෙහි භුක්ති විඳීමේ අයිතිය ඇත.
- සියලු දෙනා හට වෙනස් කොට සැලකීමකින් තොර ව හා අන්‍යයන් හා සම මට්ටමෙන් පිහිටා ප්‍රජනක සෞඛ්‍ය තාක්ෂණය, සේවා හෝ වෛද්‍යමය මැදිහත්වීම් ලබා ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අයිතිය ඇත. මෙම අයිතිය සඳහා වන වයස පාදක වූ සීමා වෙනස් කොට නොසැලකීම හා දරුවන්ගේ වර්ධනය වන හැකියාවන් පිළිබඳ ප්‍රතිපත්තියට අනුකූල විය යුතු ය.
- සියලු දෙනා හට වෙනස් කොට සැලකීමකින් තොර ව අනෙකුත් අය හා සම තත්ත්වයක හිඳ විද්‍යාත්මක පර්යේෂණවලට භාජනය වීමට හෝ එය ප්‍රතික්ෂේප කිරීමට හෝ අයිතිය ඇත.

**වගන්තිය 8**

අධ්‍යාපනයට හා තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය

සියලු දෙනා හට වෙනස් කොට සැලකීමකින් තොර ව, පෞද්ගලික, පොදු හා දේශපාලනික පරිසරයන්හි පූර්ණ පුරවැසිභාවය හා සමානාත්මතාව ක්‍රියාවේ යෙදවීමට උදව් වන හා අවශ්‍ය වන පූර්ණ ලිංගිකත්ව අධ්‍යාපනය හා තොරතුරු ලබා ගැනීමේ හා සාමාන්‍ය අධ්‍යාපනය හා තොරතුරු ලබා ගැනීමේ අයිතිය ඇත.

- සියලු දෙනා හට වෙනස් කොට සැලකීම හා අපකීර්තිය තුරන් කිරීම ඉලක්ක කොට ගත්, තරුණයන් සිය ජීවිතයෙහි වගකීම් දරන දැනුවත් පිරිසක් බවට පත් කරන හා ලිංගික සෞඛ්‍යය හා ලිංගික අධ්‍යාපනය[67] පිළිබඳ ප්‍රතිපත්තිය නිර්ණය කිරීමට සහභාගී වීමෙහිලා බලවත්තකරණය කෙරෙන අධ්‍යාපනයක් ලැබීමේ අයිතිය ඇත.
- සියලු දෙනා, විශේෂයෙන් ම තරුණයන් හට පූර්ණ ලිංගික අධ්‍යාපන වැඩසටහන් සහ ලිංගිකත්ව හා සම්බන්ධ ප්‍රතිපත්ති සඳහා දායකත්වය ලබා දීමේ අයිතිය ඇත.
- සියලු දෙනා හට වඩාත් ශක්තිමත් හා වඩාත් සාධාරණ වූ සම්බන්ධතාවන් ලබා ගැනීම සඳහා වන කුසලතා හා ක්‍රමවේද වර්ධනය කර ගැනීමේ අයිතිය ඇත.
- සියලු දෙනා හට ජාතික දේශ සීමා පිළිබඳ සැලකීමකින් තොරව, ලිංගිකත්වය, ලිංගික අයිතීන් හා ලිංගික සෞඛ්‍ය වැඩි දියුණු කෙරෙන සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන තොරතුරු ලබා ගැනීමේ අයිතිය ඇති අතර විශේෂයෙන් ම තරුණ පරපුර වෙත ලිංගිකත්වට අනුකූල නොවන ජීවිත පිළිබඳ හා ලිංගික සබඳතාවලට අදාළ තොරතුරු ලබා ගැනීමේ අයිතිය ඇත.
- සියලු දෙනා හට ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය තහවුරු කර ගැනීමේ ක්‍රම හා කවදා, කොහේ, කා සමඟ ලිංගික සබඳකම් පවත්වන්නේ ද සහ ලිංගික චර්යාව ප්‍රජනක[68] බවට පත්වන්නේ කුමන විට දී ද යන්න ඇතුළු ව ප්‍රජාව, පාසල හා සෞඛ්‍ය සේවා ලබාදෙන්නන් පාදක තොරතුරු සඳහා ප්‍රවේශයක් තිබිය යුතු ය.
- සියලු දෙනා හට සිය ලිංගික හා ප්‍රජනක ජීවිතය පිළිබඳ ගන්නා ලබන ඕනෑ ම තීරණයක් පූර්ණ, නිදහස් හා දැනුවත්භාවයකින් යුත් කැමැත්තකින්[69] ගන්නා බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් අධ්‍යාපනයක් ලැබීමේ අයිතිය ඇත.

**වගන්තිය 9**

විවාහ වීමට හෝ නොවීමට හෝ පවුලක් ඇති කර ගැනීමට හෝ සැලසුම් කිරීමට හා කෙදිනක, කෙසේ දරුවන් ලබන්නේ ද, එසේත් නොමැති නම් දරුවන් නොලබන්නේ ද යන්න තීරණය කිරීමේ අයිතිය ඇත.

සියලු දෙනා හට විවාහ වන්නේ ද නොවන්නේ ද යන්න තෝරා ගැනීමට, පවුලක් සැලසුම් කරන්නේ ද, ඇති කර ගන්නේ ද යන්න තීරණය කිරීමට, දරුවන් ලබන්නේ ද යන්න තීරණය කිරීමට, දරුවන් අතර පරතරය, දරුවන් සංඛ්‍යාව තීරණයට, නිදහසේ හා වගකීම සහිත ව විවාහය[70] ප්‍රතිපත්ති හා නීති මගින් හෝ පරම්පරාවෙන් නිර්වචනය නොවන ස්වරූපයක් ද ඇතුළු පවුල යන්නෙහි විවිධත්වය පිළිගැනෙන රාමුවක් තුළ අයිතිය ඇත.

- සියලු දෙනා හට දරුවන්ගේ වර්ධනය වන හැකියාවන්ට නිසිතැන ලබා දෙමින් හා වෙනස් කොට නොසැලකීමේ රාමුවක හිඳිමින් සියලු දෙනා විෂයයෙහි පිහිටන විවාහයට හෝ වෙනත් එවැනි සබඳතාවලට පූර්ණ කැමැත්ත සහිත ව හා නිදහස් එළඹීමට අයිතිය ඇත.
- සියලු දෙනා හට පරම්පරානුගත හෝ විවාහය මගින් නිර්වචනය නොකරන ලද ස්වරූප ද ඇතුළත් ව, තමන් තෝරා ගෙන ඇති පවුල් ස්වරූපය නොසලකා රැකියා නියුක්තිය, සංක්‍රමණය ආදී වශයෙන් වූ සමාජ සුබසාධන සහ අනෙකුත් පොදු ප්‍රතිලාභ ලබා ගැනීමේ අයිතිය ඇත.
- සියලු දෙනා ඔවුන් හට දරුවන් ලබන්නේ ද නැද්ද යන්න තීරණය කිරීමට එසේ ලබන්නේ නම් කුමන කලක දී ද යන්න තීරණය කිරීමට හා ඔවුන්ගේ දරුවන් සංඛ්‍යාව හා දරුවන් අතර පරතරය වගකීම් සහිත ව නිදහසේ තීරණය කිරීමට අවශ්‍ය තොරතුරු, අධ්‍යාපනය හා ක්‍රමවේද වෙත ප්‍රවේශ වීමට අයිතිය ඇත.
- සියලු දෙනා හට යහපත හෝ හදාගත් දරුවන් ලැබීමට හෝ නොලැබීමට ඇති අයිතිය, මෙන්ම ආරක්ෂා සහිත, ඵලදායී, පිළිගත හැකි හා දැරිය හැකි මිලක් ඇති සඵල බව ලැබීමේ ක්‍රමවේද ප්‍රජනන තාක්ෂණය හා ප්‍රතිකාර ලැබීමේ අයිතිය ඇත.
- සියලු දෙනා හට විවාහක අවිවාහක බව නොසලකා හා වෙනස් කොට නොසැලකීමේ රාමුවක් තුළ දරුවන්ගේ වර්ධනය වන ශක්‍යතා ද සලකමින් ප්‍රජනන කාර්යය මඳ සරු බව සහ ගර්භනී බව වලක්වා ගැනීම පිළිබඳ උපදේශනය හා අනෙකුත් සේවා ලබා ගැනීමට අයිතියක් ඇත.

- සියලු කාන්තාවන් හට පහසු දැරිය හැකි, පිළිගත හැකි ලෙස ප්‍රජනන සෞඛ්‍ය ආරක්ෂාව, ආරක්ෂිත මාතෘභාවය හා ආරක්ෂිත ගබ්සාව ලබා ගැනීමට අයිතිය ඇත.
- සියලු දෙනා හට දරුවන් දරුකමට ලබා ගැනීම, ආරක්ෂාව ලබා දීම හා භාරකාරත්වය දැරීම පිළිබඳ ව හෝ ජාතික මට්ටමේ නීතිගත වූ ඉහත කරුණු සම්බන්ධ ආයතන විෂයයෙහි වෙනස් කොට නොසැලකීමේ රාමුවක් තුළ එක හා සමාන වගකීම් හා අයිතිය ඇත. සියලු කරුණුවල දී දරුවන් විෂයයෙහි උපරිම මූලිකත්වය ලබා දිය යුතු ය.

## වගන්තිය 10

වගවීම හා ප්‍රතිසාධනය පිළිබඳ අයිතිය

සියලු දෙනා හට ඵලදායි ප්‍රමාණවත්, සුදුසු, අධ්‍යාපන, ව්‍යවස්ථාමය හා අනෙකුත් පිළියම් තහවුරු කෙරෙන පරිදි ලිංගික අයිතිවාසිකම් පිළිබඳ රාජකාරීමය වගකීම් දරන්නන් විසින් වගවිය යුතු බවට ඉල්ලා සිටීමේ අයිතිය ඇත. මේ සඳහා ලිංගික අයිතීන් ක්‍රියාවේ යෙදවීම නියාමනය හා ප්‍රතිසංස්ථාපනය, වන්දි ගෙවීම, පුනරුත්ථාපනය, තෘප්තිමත් බවට පැමිණවීම, පුනරුච්ඡාරණය වැලැක්වීම හා වෙනත් එවැනි ක්‍රියාමාර්ග[72] ඇතුළු ලිංගික අයිතීන් කඩවීම වැලැක්වීමට පියවර ගැනීමේ ප්‍රවේශය ලැබීම ආදිය ඇතුළත් වේ

- රාජ්‍යය විසින් ලිංගික අයිතීන් තහවුරු කිරීම පිළිබඳ සිය බැඳීමට වගකිවයුතු ආයතනයන්හි ස්ථාපිත කරනු ලැබිය යුතු ය.
- සියලු දෙනා හට අවිගැටුම්වල ද විශේෂයෙන් ම, ලිංගික හා ලිංගිකත්වය පිළිබඳ ප්‍රචණ්ඩත්වය විෂයයෙහි ප්‍රතිසාධනය හා වගවීම පිළිබඳ ඵලදායි යාන්ත්‍රණයක් වෙත ප්‍රවේශ වීමේ අයිතිය ඇත.
- සියලු දෙනා හට සිය ලිංගික අයිතීන් කඩවීම පිළිබඳ ප්‍රතිකර්ම හා ආරක්ෂිත ප්‍රතිසාධනය ලබා ගැනීම පිණිස හේතුවන තොරතුරු හා උදව් ලබා ගැනීමට අයිතියක් ඇත.
- සියලු දෙනා හට රාජ්‍ය නොවන අංශවල ක්‍රියාකාරකම් හෝ පැහැර හැරීම් හේතුවෙන් සිය ලිංගික අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී ඇති වන ඵල විපාක පිළිබඳ වගකියනු ලැබීමේ අයිතිය ඇත. එයට ඔනෑ ම ලිංගික අයිතීන් කඩවීමක දී ප්‍රතිකර්ම සෙවීමේ හැකියාව හා ප්‍රතිසාධනය ද ඇතුළත් ය.

- රාජ්‍යයන් විසින් තුන්වැනි පාර්ශව මගින් සිදුවන අන්‍යයන්ගේ ලිංගික අයිතීන් උල්ලංඝනය වැලැක්වීමට පියවර ගනු ලැබිය යුතු ය.

IPPF සිය හැකියාවන් තුළ පිහිටා සිය සාමාජික සංවිධාන ලිංගික අයිතීන් පිළිබඳ පෙනී සිටීමට සිය සේවාදායකයන් මුල්කොට ගත් වෙනස් කොට නොසලකන පරිදි ලිංගික සෞඛ්‍ය පහසුකම් ලබාදීමට, පූර්ණ ලිංගිකත්ව අධ්‍යාපනයක් හා තොරතුරු ලබා දීමට හා මෙම ප්‍රකාශනයේ අන්තර්ගත මූලධර්ම හා ලිංගික අයිතීන්ට අනුකූල වන ලෙස සිය කාර්ය මණ්ඩලවලට හා ව්‍යාපෘති වැඩසටහන්වලට සහභාගි වන අයට සැලකීමට අවශ්‍ය තාක්ෂණික සහයෝගීතාව සැලසීම, ශක්‍යතා වර්ධනය හා මූල්‍යමය ආධාර සැපයීම ඇතුළු සියලු දේ කිරීමට කැපවී සිටියි.

මෙම සටහන් මගින් ලිංගික අයිතීන්: IPPF ප්‍රකාශනයෙන් සඳහා පාදක වන මූලධර්ම හා හිමිකම්වලට පාදක මූලාශ්‍ර හඳුනා ගැනේ. මෙම මූලාශ්‍රවලට අන්තර්ජාතික මානව හිමිකම් පිළිබඳ හර ලේඛන හා අන්තර්ජාතික ප්‍රමිති පිළිබඳ බලාධිකාරී නිර්වචන ඇතුළත් යත එමෙන් ම අප විසින් ප්‍රධාන අන්තර්ජාතික ප්‍රමිතීන්හි ඇතුළත් බවට IPPF ආයතනය විශ්වාස කරන අතිරේක හිමිකම් විෂයයෙහි සහාය වන මූලාශ්‍ර ද ඇතුළත් කරනු ලැබ ඇත. මෙම මූලාශ්‍රවලට ජාතික රාජ්‍යවල නීති හා ප්‍රතිපත්ති, ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ විද්වතුන් විසින් ප්‍රකාශිත කරුණු, අනුදැනීම් හා IPPF සාමාජික සංවිධාන විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග ද ඇතුළත් ය.
http://www.ippf.org/en/Resources/Statements/IPPF+Charter+on+Sexual+and+Reproductive+Rights.htm

1995 ලිංගික හා ප්‍රජනක අයිතීන් පිළිබඳ ප්‍රඥප්තියේ සම්පූර්ණ ලේඛනය මෙම අන්තර්ජාල අඩවියේ ඇත.
http://www.ohchr.org
එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් ආයතනවල වාර්තා හා අන්තර්ජාතික ප්‍රමිතීන් පිළිබඳ බොහෝ ලේඛන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලයේ වෙබ් අඩවියෙන් ලබාගත හැකිය. http://www.ohcir.org

ලිංගික අයිතිවාසිකම් හා ලිංගික සෞඛ්‍යය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සඳහා:
http://www.who.int/reproductive-health/gender/sexualhealth.htm#4

ලිංගික දිශානතිය හා ලිංග අනන්‍යතාව විෂයයෙහි අන්තර්ජාතික මානව හිමිකම් නීතිය ක්‍රියාවේ යෙදවීම පිළිබඳ ප්‍රතිපත්ති පිළිබඳ සම්පූර්ණ ලේඛනය. (yogyakarta Principles) (2007) පහත වෙබ් අඩවියෙන් ලබාගත හැක. http://www.yogyakartaprinciples.org

[1.]මානව හිමිකම් පිළිබඳ අන්තර්ජාතික පනත

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ^&

සිවිල් අයිතීන් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුම () හා

එහි වෛකල්පිත මුල් කෙටුම්පත් දෙක

ආර්ථික සමාජීය හා සංස්කෘතික අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුම.

ප්‍රධාන අන්තර්ජාතික මානව හිමිකම් ආයතන හා ඒවායේ නියාමන ඒකක

සකලවිධ වාර්ගික කොන් කිරීම පිටුදැකීම සඳහා වන අන්තර්ජාතික ප්‍රඥප්තිය (ICERD)

නියාමන ඒකකය (CERD)

කාන්තාවන්ට එරෙහි විවිධ කොන්කිරීම් පිටුදැකීම සඳහා වන ප්‍රඥප්තිය (CEDAW)

නියාමන ඒකකය CEDAW හා එහි වෛකල්පිත කෙටුම්පත.

හිංසාව හා කෲර, අමානුෂික හෝ අවමන් සහිත සැලකිලිවලට එරෙහි ප්‍රඥප්තිය (CAT)

නියාමන ඒකකය : ක්ඔ හා එහි වෛකල්පිත කෙටුම්පත.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය (CRC) හා එහි වෛකල්පිත කෙටුම්පත් 2.

නියාමන ඒකකය :

සියලු සංක්‍රමණික සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල සුරක්ෂිතභාවය පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තිය (CMW)

නියාමන ඒකකය (MW)

ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිය සඳහා වන ප්‍රඥප්තිය (බලසහිත වූ දිනය: 2008 මැයි 3)

බලහත්කාරයෙන් අතුරුදහන් කරවීමෙන් සියලු දෙනා ආරක්ෂා කිරීම සඳහා වන ප්‍රතිඥාව (2008 මැයි සිට බලාත්මක නැත).

මූලික මානව අයිතිවාසිකම් ලියවිලිවලට අමතර ව නීතිමය වශයෙන් නොබැඳුණේ වුවද රාජ්‍යයන් වෙත සිය හැසිරීම පිළිබඳ මඟ පෙන්වන හා ප්‍රතික්ෂේප නොකළ හැකි සදාචාරාත්මක බලයක් වන අන්තර්ජාතික මානව හිමිකම් ලියවිලි ගණනාවක් ඇත. ඒවා නම්:

වියානා ප්‍රකාශනය හා ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන

එක්සත් ජාතීන්ගේ සහශ්‍රක ප්‍රකාශනය

එක්සත් ජාතීන්ගේ කාන්තාවන්ට එරෙහි හිංසනය පිටුදැකීම පිළිබඳ ප්‍රකාශනය

සංවර්ධනයට ඇති අයිතිය පිළිබඳ ප්‍රකාශනය

විවාහයට කැමැත්ත, විවාහය සඳහා හා විවාහය ලියාපදිංචිය සඳහා අවම වයස පිළිබඳ ප්‍රඥප්තිය

එච්.අයි.වී. ඒඩ්ස් වැලකීම සඳහා කැපවීම

[2]'CESR කමිටුව දක්වන ආකාරයට සෞඛ්‍යය සඳහා ඇති අයිතිය කෙනෙකුගේ සෞඛ්‍ය හා ශරීරය පිළිබඳ ව තීරණය කිරීමේ අයිතිය, ලිංගික හා ප්‍රජනක නිදහස ඇතුළු කරුණුවලින් සමන්විත වෙයි. ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන් පිළිබඳ කමිටුව: පොදු ප්‍රකාශය 14 : ලබාගත හැකි ඉහළ ම සෞඛ්‍ය තත්ත්වයන් ළඟා කර ගැනීමේ අයිතියත් එ. ජ. ලේඛනය EIC 12/2004/4 11 200 අගෝස්තු

[3.]මානව හිමිකම් කොමිෂන් සභාවේ 60 වැනි සැසියට ඉදිරිපත් කෙරුණු සෞඛ්‍යය සඳහා ඇති අයිතිය පිළිබඳ ව විශේෂ සැසියේ වාර්තාව, එ.ජා. ලේඛනය EIC 12/2004/49 (2004)

[4.]ලිංගිකත්වය සමාජ හා පුද්ගලභාවයන් අතරමැද ලක්ෂයක පිහිටා ඇති අතර එය දේශීය හා අන්තර් ක්‍රියාවලියකින් මතුවේ.

[5].සෞඛ්‍යයට ඇති අයිතිය පිළිබඳ විශේෂ සැසියේ වාර්තාව ෑ්රැක්‍ණහ4ර්. 2004/49 (2004)

[6]එවැනි අවස්ථා හඳුනා ගැනීමේ ක්‍රියා පිළිවෙල සාමාජික සංවිධාන විසින් රටක නීතිය ද ඇතුළත් ව ඔවුන්ගේ රටවල සංදර්භයට අදාළ වූ විශේෂිත කරුණු හේතුවෙන් උපාමාර්ගික රාමුවේ සියලු ඉලක්ක ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් ක්‍රියාවේ යෙදවීම හා සමාන ය. සාමාජික සංවිධානය මගින් එහිදී රට පිළිබඳ විග්‍රහාත්මක විශ්ලේෂණයක් මගින් තත්ව වාර්තාවක් සකස් කරනු ලබන අතර කලාපීය අධ්‍යක්ෂ/ කලාපීය විධායක කමිටුව සමඟ ගිවිසුමකට එළඹෙනු ලබයි.

[7].බලන්න P’ Ilkkaracan S. Jolly, Gender and Sexuality: Overview Report (Bridge Institute for Development Studies, 2007)

http://www.bridge.ids.ac.uk/reports-gend-CEP.html#Sexuality

[8]සාධාරණත්වය යනු වගකීම් හා ප්‍රතිලාභ බෙදීයාමේ ඇති සාධාරණ බව යි. ලිංග සාධාරණත්වය යන සංකල්පය විසින් මිනිසුන් හා ගැහැනුන් හට වෙනස් වූ උවමනා එපාකම් හා බලතල ඇති බවත් එම වෙනස්කම් හඳුනා ගැනීම හා ආමන්ත්‍රණය, ස්ත්‍රී පුරුෂ බව අතර අසමතුලිත බව සටහන් කෙරෙන අයුරින් කළ යුතු බවත් හඳුනා ගනු ලබයි.

[9].සමානාත්මතාව යනු සේවා සඳහා ප්‍රවේශ වීමේ දී, සම්පත් හා ප්‍රතිලාභ බෙදී යාමේ දී හා අවස්ථා සැලසීමේ දී වෙන් කොට සැලකීමත් නොමැති වීම යි.

[10].ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය යනු මිනිසුන් හා ගැහැනුන් අතර අවශ්‍යතා වෙනත් අවස්ථාවල දී සම්පත් හා උපයෝගික අවධානය එම අවශ්‍යතාවලට සමානුපාතික විය යුතු වීම, සමාන අවස්ථා සුරක්ෂිත විය යුතු වීම හා අවශ්‍ය විට දී ප්‍රතිඵලවල සමානත්වය ඇති කිරීම පිණිස වෙනස් අවධානයක් හා සැලකිල්ලක් යොමු කළ යුතු වීම හා ඓතිහාසික ව කාන්තාව විසින් අත්විඳින ලද අවාසි ප්‍රතිසාධනය යි.

[11].ස්ත්‍රී පුරුෂ සමානත්වය යනු මිනිය හැකි ස්ත්‍රී හා පුරුෂ එක සමාන නියෝජනයකි. ස්ත්‍රී පුරුෂ සමානත්වය ස්ත්‍රීන් හා පුරුෂයින් එක හා සමාන බවට අදහස් නොකරන අතර ඔවුන් සමාන වටිනාකම් දරන අතර එක හා සමාන ලෙස සලකනු ලැබිය යුතු බව අදහස් කරයි. ස්ත්‍රී පුරුෂ සමාන බව යනු, බලය හා බලපෑම් බෙදී යාමේ දී සමාන ලෙස සිදු වීම, සමාන අවස්ථා ලැබීම, සේවය හෝ ආදායම් ඉපයීම් විෂයයෙහි රාජ්‍ය

මෙන්ම පෞද්ගලික අංශයේ දී ද සමාන අයිතීන් ලැබීම, ගුණාත්මක අධ්‍යාපනයක් සමානව ලැබීම හා ශක්‍යතා වර්ධනය සඳහා අවස්ථා ලැබීම, සිය පූර්ණ ශක්‍යතාව වර්ධනයට අවස්ථා ලැබීම, පවුල තුළ, සමාජය තුළ සම්පත් හා සේවා සඳහා සම ප්‍රවේශයක් ලැබීම, හා නීතිය ඉදිරියේ හා ප්‍රතිපත්ති විෂයයෙහි සමාන ලෙස සලකනු ලැබීම සඳහා ස්ත්‍රීන්ට හා පුරුෂයන් හැකි වීම ය. ස්ත්‍රී පුරුෂ සමානත්වය යනු ස්ත්‍රීන් හා පුරුෂයන් සමාන වීම නොවන අතර එය ඔවුන්ගේ අයිතීන්, වගකීම් හා අවස්ථාවන් ලිංගිකත්වය මත පදනම් නොවීම ය.

[12].ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, වගන්තිය 5: අනුව සියලු පාර්ශවයන් විසින් දෙමාපියන්ගේ හෝ අදාළ වන අවස්ථාවල දී විස්තෘත පවුල් සාමාජිකයන්ගේ හෝ සමාජ චාරිත්‍ර විධිවලට අනුව සැලසෙන පරිදි නීතියෙන් නිශ්චිත භාරකරුවන්ගේ හෝ නීතියෙන් දරුවන්ගේ භාරකාරත්වය ලබන පුද්ගලයන් සතු වර්තමාන ප්‍රඥප්තිය මගින් හඳුනා ගැනෙන ළමා අයිතිවාසිකම් සපුරාලීම විෂයෙහි ඇති වගකීම්, යුතුකම් හා අයිතීන් ගරු කොට සලකනු ලැබේ. www.ohchr.org/english/law/crc.htm

[13].ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය නිශ්චිත කරන පරිදි අයිතිවාසිකම් හිමිවන්නේ වයස අවුරුදු 18ට අයට ය. අන්තර්ජාතික නීතියේ වර්තමාන භාවිතයට අනුව වයස අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍ය ජීවියෙකු ළමයෙක් වේ.
ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, වගන්තිය වර්තමාන ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා ළමයෙක් යනුවෙන් හැඳින්වෙන්නේ ළමයින්ට අදාළ නීතිය මගින් පූර්වයෙහි බහුතරය විසින් දක්වා නොමැති නම් වයස අවුරුදු 18ට අඩු ඕනෑම මනුෂ්‍ය ජීවියෙකු ය.

[14].ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, වගන්තිය 3: (1) ළමයින් හා සම්බන්ධ සියලු ක්‍රියාවන්හි දී, ඒවා ක්‍රියාවට නගනුයේ රාජ්‍ය හෝ පුද්ගලික සුබසාධන ආයතන අධීක්ෂණය, පරිපාලන හෝ ව්‍යවස්ථාපිත ආයතන මගින් වුව ද මූලික සලකා බැලීම විය යුත්තේ ළමයින්ගේ පූර්ණ යහපත ය. (2) ළමයින්ගේ යහපත සඳහා අවශ්‍ය වන තාක් ආරක්ෂාව හා පාලනය තහවුරු කිරීමට වගකීම ලබන පාර්ශව විසින් ළමයාගේ දෙමාපියන්, නීත්‍යානුකූල භාරකරුවන් හෝ ළමයාගේ වගකීම දරන වෙනත් නීත්‍යානුකූල පුද්ගලයන්ගේ වගකීම් හා අයිතීන් සැලකිල්ලට ගනිමින් උචිත සියලු පරිපාලනමය හා ව්‍යවස්ථාමය පියවර ගනු ලැබේ.(3) අනුව ළමයාගේ ආරක්ෂාව හා පාලනය පිළිබඳ

වගකීම දරන ආයතන, සේවා හා පහසුකම් විශේෂයෙන් ම ආරක්ෂාව, සෞඛ්‍ය සේවක සංඛ්‍යා හා සේවක යෝග්‍යතාව මෙන් ම නිසි සුපරීක්ෂාව ද පිළිබඳව නිසි බලධාරීන් විසින් නිර්මිත තත්වයන්ට අනුකූල ව පවත්වා ගත යුතු ය.

[15] ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, වගන්තිය 5: අනුව දෙමාපියන්, හෝ අදාළ අවස්ථාවන්හි දී දේශීය චාරිත්‍ර මගින් දක්වා ඇති පරිදි විස්තෘත පවුලේ සාමාජිකයාගේ ජන කොට්ඨාසයේ සාමාජිකයන්, නීත්‍යානුකූල භාරකරුවන් හෝ ළමයා පිළිබඳ නීත්‍යානුකූල වගකීම ඇති පුද්ගලයන් හෝ විෂයයෙහි ළමයින්ගේ වර්ධනය වන ශක්‍යතාවලට අනුකූල ව හා වත්මන් ප්‍රඥප්තියේ හඳුනා ගත් ළමයාගේ අයිතීන් ක්‍රියාවේ යෙදීමට දැක්වෙන පෙදෙස් හා මඟපෙන්වීම්වලට අනුව ඇති අයිතීන් හා වගකීම් සියලු පාර්ශව විසින් කරනු ලැබිය යුතු ය.

[16] ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, වගන්තිය 2.1: අනුව සියලු පාර්ශව ළමයාගේ හෝ දෙමාපියන්ගේ හෝ නීත්‍යානුකූල භාරකරුවාගේ ජනවර්ගය, වර්ණය, ලිංගිකත්වය, භාසාව, ආගම, දේශපාලන හෝ වෙනත් අදහස් ජාතික, ජාතිකත්ව හෝ සමාජ සම්භවය, දේපල, ආබාධිත තත්වය, උපත හෝ වෙනත් තත්වයන් මුල් කොටගත් කිසිඳු වෙනස්කමකට භාජනය නොකර සෑම ළමයකු විෂයයෙහි නීතිමය සීමාව තුළ වත්මන් ප්‍රඥප්තිය මගින් දක්වා ඇති අයිතීන් තහවුරු කළ යුතු හා ඒවාට ගරු කළ යුතු ය.

[17] .ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, වගන්තිය 6.2: අනුව පාර්ශව ළමයාගේ සංවර්ධන හා ජීවත් වීම හැකි උපරිම අයුරින් තහවුරු කළ යුතු ය.

[18] .වෙනස් කොට නොසැලකීමේ රාමුව මෙම ලේඛනයේ දැක්වෙන වෙනස් කොට සැලකීම පිළිබඳ සියලු සටහන්වලට අදාළ ය.

[19] ලිංගිකත්වය යනුවෙන් දැක්වෙන්නේ මිනිසුන් ස්ත්‍රී හෝ පුරුෂ යනුවෙන් නිර්ණය කෙරෙන ජෛව විද්‍යාත්මක ලක්ෂණ අනුව ය. මෙම ජෛව විද්‍යාත්මක ලක්ෂණ, දෙවර්ගයටම අයත් ලක්ෂණ සහිත පුද්ගලයෝ ද හිඳින බැවින්, අන්‍යොන්‍ය වශයෙන් සීමා නොවන අතර, මිනිසුන් ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් කරයි.

[20].මෙම ප්‍රඥප්තිය 2 වන මූලධර්මය බලන්න. වයස අනුව වෙනස් කොට සැලකීම වැඩිහිටි අයට ද එක සේ අදාළ ය.
ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය, වගන්තිය 2.2: වර්තමාන සම්මුතියට අදාළ සියලු පාර්ශව වත්මන් සම්මුතියෙන් දක්වා ඇති සියලු අයිතීන් කිසිඳු ආකාරයක ජන වර්ගය, වර්ණය, ලිංගිකත්වය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මතවාද, ජාතික හෝ සමාජයීය සම්භාවය, දේපල, උපත හෝ වෙනත් තත්ත්වයන් මත පදනම් වූ වෙනස් කිරීමකට භාජනය නොකර ක්‍රියාවේ යෙදවීම සහතික කළ යුතු ය.

[21].ලිංගිකත්වය යනු යම් කාලයක දී ස්ත්‍රී හෝ පුරුෂ වීම පිළිබඳ ව ඇති සමාජීය, සංස්කෘතික හා ආර්ථික ආකල්පය.

[22].ලිංගික අනන්‍යතාව යනු ස්ත්‍රී හෝ පුරුෂ බව පිළිබඳ යම් පුද්ගලයෙකුගේ අභ්‍යන්තර ආත්මාවබෝධය ය.

[23].ලිංගික දිශානතිය යනු ස්වකීය ලිංගිකයන්, විරුද්ධ ලිංගිකයන් හෝ දෙවර්ගය කෙරෙහි ම ඇති වන ප්‍රාථමික ලිංගික ආකර්ෂණය යි.

[24].සියලු ක්ෂේත්‍ර හා ජනවර්ගය, ලිංගිකත්වය හා ලිංගත්වය සම්බන්ධ සන්දර්භයන්හි වාර්ගික වෙනස් කොට සැලකීමේ දැනට පවතින හා අරමුණු සහිත ආකාරයන්ට අදාළ වෙනස් කොට නොසැලකීමේ ජාත්‍යන්තර නීතියේ අර්ථකථන පිළිබඳ උදාහරණ සඳහා මානව හිමිකම් කමිටුවේ අංක 18 වෙනස් කොට නොසැලකීම. (Non-discrimination) මැයෙන් වූ පොදු ප්‍රකාශය බලන්න.
UNDOC. HRI/GEN/1 Rev.6at 146, 2003
එසේ ම සියලු වර්ගයේ වාර්ගික වෙනස් කොට සැලකීම් පිටු දැකීම සඳහා වන කමිටුවේ වාර්ගික වෙනස්කොට සැලකීමේ ලිංගත්වය පදනම් වූ මානයන් (Gender-related dimensions of racial discrimination) මැයෙන් වූ 25 වන පොදු උපදේශය ද බලන්න. UN/DOC A/55/18,2000.

[25].CLADEM ප්‍රකාශය (ලිඛිත හා ප්‍රජනක අයිතීන් පිළිබඳ ප්‍රඥප්තියක් සඳහා වූ ව්‍යාපාරය 2006 ඔක්තෝබර්) පි. 26.
http://www.convencion.org.uy

[26]කලාපීය අධිකරණයක් මගින් ලිංගික හිරිහැරයට එරෙහි ව කලකට පෙර ලබා දුන් සුවිශේෂී තීන්දුවක් සඳහා බලන්නː මානව හිමිකම් සඳහා වූ යුරෝපීය අධිකරණය, *X AND Y v. the Netherlands*, 1985 මාර්තු 25.

[27]ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, වගන්තිය 34: ළමයා සියලු ආකාරයේ ලිංගික සූරාකෑමෙන් හා අපයෝජනයෙන් ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශව කටයුතු කළ යුතු ය. මෙහිදී සියලු පාර්ශව විසින් (9) ළමයින් කිසිඳු ආකාරයේ නීතිවිරෝධී ලිංගික ක්‍රියාවක නිරත වීමට බලකිරීමට හෝ පොළඹවනු ලැබීම (ආ) ළමයින් බලහත්කාරයේ ගණිකා වෘත්තිය ඇතුළු නීති විරෝධී වෙනත් කටයුතුවල යෙදවීම (ආ) ළමයින් බලහත්කාරයෙන් අසභ්‍ය ක්‍රියාවන්හි හා ප්‍රකාශනවල යොදා ගැනීම වැලැක්වීම සඳහා උචිත ජාතික, ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

[28]මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය,
වගන්තිය 29: (1) සෑම පුද්ගලයෙකු සිය පෞරුෂයේ පූර්ණ හා නිදහස් වර්ධනය යථාර්ථවත් කෙරෙන සමාජය කෙරෙහි ඇති යුතුකම් තිබේ (2) සිය නිදහස හා අයිතීන් ක්‍රියාවේ යෙදවීමේ දී සෑම අයෙකු ම අන්‍යයන්ගේ නිදහස හා අයිතීන් කෙරෙහි ඇති ගෞරවය හා පිළිගැනීම ආරක්ෂා කිරීම හා ප්‍රජාතන්ත්‍රික සමාජයීක සදාචාරත්මක බවේ සාධාරණ අවශ්‍යතා ඉටු කිරීම පූර්ණ වශයෙන් ම අරමුණු කොට ගත් නීතිය මගින් හඳුනා ගන්නා ලද සීමාවන්ට පමණක් විෂය විය යුතු ය. (ඇ) මෙම අයිතීන් හා නිදහස මොනයම් අවස්ථාවක දී හෝ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය හා අරමුණුවලට පටහැනි ආකාරයට නොයෙදිය යුතුය.

http://www.un.org/Overview/right.html.

[29]ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය. වගන්තිය 12:
(1) වත්මන් ප්‍රඥප්තියට අදාළ සියලු පාර්ශව, භෞතික හා මානසික සෞඛ්‍යයේ
ළඟා විය හැකි ඉහළ ම තත්ත්වයන් අත්විඳීම සඳහා ඇති අයිතිය හඳුනා ගෙන
ඇත. (2) ප්‍රඥප්තියට අදාළ පාර්ශවය විසින් අයිතියේ පූර්ණත්වය ළඟා කරගනු ලැබීම සඳහා ගත යුතු පියවරවලට පහත කරුණු ඇතුළත් විය යුතු ය. (1) මළ දරු උපත් ප්‍රතිශතය අඩුකර ගැනීමට, උපතේ සිදුවන ළදරු මරණ සංඛ්‍යාව අඩු කර ගැනීමට හා ළමයාගේ සෞඛ්‍ය සම්පන්න වර්ධනයට අවශ්‍ය කරුණු සපයා දීම. (2) පාරිසරික හා

කාර්මික ස්වස්ථතාව පිළිබඳ සියලු කරුණුවල සෑම අංගයක ම වර්ධනය (3) ආවේණික, වසංගත, රැකියාවලට සම්බන්ධ හා අනෙකුත් රෝග වැලකීම හා පාලනය. (4) අසනීපයක් ඇති වූ අවස්ථාවේ දී සියලු දෙනා හට වෛද්‍ය සේවා හා අවධානය තහවුරු කෙරෙන තත්ත්වයක් නිර්මාණය කිරීම
වැඩි දුරටත් ආර්ථික, සමාජයීය හා සංස්කෘතිකමය අයිතීන් පිළිබඳ කමිටුවේ 14 වැනි පොදු ප්‍රකාශය බලන්න: ,ළඟාවිය හැකි ඉහළම සෞඛ්‍ය තත්වය සඳහා ඇති අයිතිය, : The right to the highest attainable standard of health) UN Document E/C.12/2004/4 11 200 අගෝස්තු 28 – 29 පරිච්ඡේද.

[30.]මෙම මූලධර්මයෙහි ප්‍රකාශිත නියම ඉලක්ක හා පරමාර්ථ හා එකඟ නොවන නීතියෙන් ස්ථාපිත සීමා වෙනස් කිරීම සඳහා ක්‍රියාකළ යුතු ය.
CLADEM ප්‍රකාශය බලන්න ($2^{nd}$ version ) පිටුව 33
http://www.convencion.org.uy
[31.]සංවර්ධන සහයෝගීතාව සඳහා වන මානව අයිතිවාසිකම් මූලික ප්‍රවේශය: එ.ජ. නියෝජිතායතන අතර පොදු එකඟතාවක් සඳහා:
www.undp.org/governance/docs/HR_Guide_CommonUnderstanding.pdf

[32.],ගරු කිරීම, ආරක්ෂා කිරීම හා සපුරාලීම, සංකල්පය උපුටා ගෙන ඇත්තේ ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතීන් පිළිබඳ කමිටුවෙනි. එය ජාත්‍යන්තර ආර්ථික, සමාජයීය හා සංස්කෘතික, ප්‍රඥප්තිය නියාමනය කරන ආයතනය යි. එය සිදුවනුයේ අනෙකුත් අයිතීන් අතර සෞඛ්‍යයට ඇති අයිතිය පිළිබඳ සියලු පාර්ශවයන්හි ඇති බැඳීම විශ්ලේෂණය මගිනි. ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතීන් පිළිබඳ කමිටුව (CESCR) පොදු නිර්දේශ අංක 14, 34 – 37 පරිච්ඡේද.

[33.]බලන්න CESCR පොදු නිර්දේශ අංක 14, පරි. 39

[34.]මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය, 1948 වගන්තිය 1: සියලු මනුෂ්‍යයෝ උපතින් ම නිදහස් හා අයිතිවාසිකම් හා ගෞරවය විෂයයෙහි සමාන වෙති.

[35]දේශපාලන හා සිවිල් අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය, වගන්තිය 2 (1): වත්මන් ප්‍රඥප්තියට අදාළ සෑම පාර්ශවයක් ම ප්‍රඥප්තියේ දැක්වෙන අයිතිවාසිකම් එහි සීමා හා නීතිමය සීමා තුළ සියලු පුද්ගලයන් සඳහා සහතික කිරීමට බැඳී සිටියි. එහිදී වාර්ගිකත්වය, වර්ණය, ලිංගිකත්වය, භාෂාව, ආගම, දේශපාලනික හෝ වෙනත් අදහස්, ජාතික හෝ සමාජ ප්‍රභවය, දේපල, උපත හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳ සීමා නොසැලකේ.

වගන්තිය 3: වත්මන් ප්‍රඥප්තියට අදාළ සියලු පාර්ශව එහි දැක්වෙන සිවිල් හා දේශපාලන අයිතීන් භුක්තිවිඳීමේ දී ස්ත්‍රී හා පුරුෂ යන දෙකොටසට ම සමාන අයිතිවාසිකම් සහතික කිරීමට බැඳ සිටී.

වගන්තිය: සියලු දෙනා නීතිය ඉදිරියේ සමාන වන අතර කිසිඳු වෙනස්කමකින් තොරව නීතියේ ආරක්ෂාව ලැබීමට අයිතිය ලබති. මෙහිදී නීතිය මගින් වෙනස් කොට සැලකීම පිටුදැකිය යුතු අතර සියලු දෙනා හට වාර්ගිකත්වය, වර්ණ, ලිංගිකත්වය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් අදහස්, ජාතික හෝ සමාජීය ප්‍රභවය, දේපල, උපත හෝ වෙනත් තත්ත්වයන් ආදී කිසිදු කරුණක් පදනම් වූ වෙනස් කොට සැලකීමෙන් සමාන හා ඵලදායි ආරක්ෂාව සැලසිය යුතු ය.

මානව හිමිකම් කමිටුව ද මෙම ලිංගිකත්වය පදනම් කොටගත් වෙනස් කොට සැලකීම පිළිබඳ ව වූ ප්‍රතිපාදන නිර්වචනය කොට හා භාවිතාවේ යොදා ඇත. (කියවන්න

කාන්තාවන්ට එරෙහි වූ සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් පිටුදැකීමහ සඳහා වන ප්‍රඥප්තිය, 1979, වගන්තිය 1: වත්මන් ප්‍රඥප්තියට අනුව ,කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම, යන සඳහනෙන් අර්ථවත් වන්නේ දේශපාලන, ආර්ථික, සමාජයීය, සංස්කෘතික, සිවිල් හෝ වෙනත් ඕනෑ ම ක්ෂේත්‍රයක දී මානව හිමිකම් හා මූලික නිදහස, විවාහක අවිවාහක බව නොතකා ස්ත්‍රී හා පුරුෂ සමානතාය මත පදනම්ව, කාන්තාව විෂයයෙහි භුක්ති විඳීම හෝ ක්‍රියාවේ යෙදවීම නිශ්ක්‍රීය කරන හෝ එයට හානි පමුණුවන ලිංගිකත්වය පදනම් කොට ගත් ඕනෑම වෙන් කිරීමක්, නොසලකා හැරීමක් හෝ සීමා කිරීමත් ය.

බලන්න “the committee on the Elimination of All from of Racial Discriminations (සියලු ආකාරයේ වාර්ගික වෙනස් කොට සැලකීම පිටු දැකීම සඳහා වූ කමිටුව) General Recommendation 25, UNDOC A/55/18, 2000.

හා

එ.ජා. ආර්ථික හා සමාජයීය කවුන්සිලයේ ජාතිවාදයට එරෙහි ලෝක සම්මේලනය වෙත ඉදිරිපත් කරන වාර්ගික වෙනස් කොට සැලකීම හා ලිංගික දිශානතිය අනුව වෙනස් කොට සැලකීම අතර සබඳතා විග්‍රහ කෙරෙන ලේඛනය E/CN.4/1999/WG.1/B.P.7 (1999)

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, 1989, වගන්තිය 2 (1) ,සියලු පාර්ශව වත්මන් ප්‍රඥප්තියේ දක්වා ඇති සෑම ළමයෙකු ම වෙනුවෙන් දක්වා ඇති අයිතීන් දරුවාගේ හෝ ඔහුගේ හෝ ඇයගේ දෙමාපියන්ගේ හෝ නිත්‍යානුකූල භාරකරුගේ වාර්ගිකත්වය, වර්ණය, ලිංගිකත්වය, භාෂාව, ආගම, දේශපාලනික හෝ වෙනත් අදහස් ජාතික ජනවාර්ගික හෝ සමාජයීය ප්‍රභවය, දේපල, ආබාධිත බව, උපත හෝ වෙනත් තත්ත්වයන් මත පදනම් වූ වෙනස් කොට සැලකීමකින් තොරව සිය නීත්‍යානුකූල රාමුවතුළ පිහිටා සහතික කළ යුතු හා ගරු කළ යුතු වන්නේ ය. (2) ,සියලු පාර්ශව ළමයාගේ දෙමාපියන්, නීත්‍යානුකූල භාරකරුවන් හෝ පවුලේ සාමාජිකයන්ගේ තත්ත්වය, ක්‍රියාකාරකම්, ප්‍රකාශිත අදහස් හෝ විශ්වාසයන් මත පදනම් ව කෙරෙන දඬුවම් කිරීම් හෝ වෙනස් කොට සැලකීම්වලින් ආරක්ෂා කිරීම තහවුරු කිරීම සඳහා සියලු උචිත පියවර ගත යුතු වන්නේ ය.

ආබාධිත තත්ත්වයන් සහිත පුද්ගලයන්ගේ හිමිකම් පිළිබඳ ප්‍රඥප්තිය, වගන්තිය 1, 2 සහ 3 හා වගන්තිය 5 හි දැක්වෙන වෙනස් කොට සැලකීමට එරෙහි විශේෂිත තහනම් කිරීම්: 1.සියලු පාර්ශව සියලු දෙනා නීතිය ඉදිරියේ හා නීතිය යටතේ සමාන බව හා වෙනස් කොට සැලකීමකින් තොරව නීතියේ ආරක්ෂාව හා ප්‍රතිලාභ සමාන ලෙස ලැබීමට හිමිකම් ලබන බව හඳුනා ගත යුතු ය.

2. සියලු පාර්ශව ආබාධිත තත්ත්වය මත සිදු කෙරෙන සියලු වෙනස් කොට සැලකීම් තහනම් කළ යුතු අතර ආබාධිත පුද්ගලයන් හට සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම්වලට එරෙහි සමාන හා ඵලදායී නීතිමය ආරක්ෂාව සහතික කළ යුතු ය.

තවදුරටත් බලන්න, ආබාධිත සහිත වූවන්ගේ හිමිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තියෙන් අර්ථ දැක්වෙන ආකාරයට ,ආබාධිත තත්වය හේතුවෙන් වන වෙනස් කොට සැලකීම, යනු දේශපාලන, ආර්ථික, සමාජයීය, සංස්කෘතික, සිවිල් හෝ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක දී සියලු මානව හිමිකම් හා මූලික නිදහස අන් අය හා සමාන තත්වයක හිඳ හඳුනා ගැනීම, භුක්ති විඳීම හෝ ක්‍රියාවේ යෙදවීම නිශේධ කරන හෝ වලක්වන ඕනෑම බෙදීමක් නොසලකා හැරීමක් හෝ සීමා කිරීමක් ය.

[36]ලිංගිකත්වය පදනම් කොටගත් විශේෂයෙන් ම ලිංගික දිශානතිය පදනම් කරගත් වෙනස් කොට සැලකීම වැලැක්වීම පිළිබඳ විශේසිත මූලාශ්‍ර මානව හිමිකම් කමිටුවේ පනස්වන සැසි වාරයේ තීරණවලින් ලබා ගත හැකි ය. Communication No. 488/1992, U.N. Doc CCPR/C/50/D/488/1992 (1994): http://hrw.org/lgbt/pdf/toonen.pdf

බලන්න,I. Saiz, "Bracketing Sexualitity: Human Rights and Sexual Oriertation A Decade of Development at the UN", (2) සෞඛ්‍ය හා මානව හිමිකම් ත්‍රෛමාසිකය, 49, 80, 2004.

ලිංගිකත්වය පිළිබඳ විශ්වාස හේතුවෙන් සමානත්වය අහිමි කරන ලද ස්ත්‍රීන් සඳහා, මානව හිමිකම් කමිටුවේ පොදු නිර්දේශ අංක 28 හා ICCPR වගන්තිය 3 (,ස්ත්‍රීන් හා පුරුෂයන් අතර හිමිකම්වල සමානාත්වය) බලන්න UNDOC CCPR/C/21/Rev.1/ADD.10 (2000).

[37]එක්සත් ජාතීන්ගේ පොදු එකඟතා ප්‍රකාශය : සංවර්ධන සහයෝගීතාව සඳහා වූ මානව හිමිකම් පාදක ප්‍රවේශය-එ.ජ. නියෝජිතායතන අතර පොදු එකඟතාවක් සඳහා UN Inter-Agency Workshop, May 2003.

[38]උදාහරණ සඳහා බලන්න. කාන්තාවන්ට එරෙහි සියලු වර්ගයේ වෙනස් කොට සැලකීම් පිටුදැකීම සඳහා වන ප්‍රඥප්තිය, වගන්ති 7: සියලු පාර්ශව විසින් රටක දේශපාලන හා පෞද්ගලික ජීවිතයේ දී කාන්තාවන්ට එරෙහි සියලු වර්ගයේ වෙනස් කොට සැලකීම පිටු දැකීම සඳහා සියලු පියවර ගත යුතු අතර පුරුෂ පක්ෂය හා සමානව ම (අ) සියලු මැතිවරණවල දී හා මහජන මත විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීමට සහ මහජන ඡන්දයෙන් නියෝජිතයින් තෝරා ගන්නා ආයතනවලට තේරී පත්වීමට සුදුසුකම් ලැබීමට (ආ)රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ දී සහභාගි වීමට, තනතුරු දැරීමට හා රජයේ සියලු මට්ටම්වල දී පොදු ක්‍රියාකාරකම්හි නියැලීමට (ඇ) රටේ පොදු හා දේශපාලන කරුණු සම්බන්ධ රාජ්‍ය නොවන සංවිධානවල නියැලීමට ඇති අයිතිය සුරක්ෂිත කළ යුතු ය.

මෙය තවදුරටත් කමිටුවේ පොදු නිර්දේශ අංක 23 (දේශපාලන හා සමාජ ජීවිතය, 16 වැනි සැසි වාරය 1997) යටතේ දක්වා ඇත.

තවදුරටත් බලන්න Yogyakatra Principle 25.

[39]මානව හිමිකම් හා එච්.අයි.වී. ඒඩ්ස් පිළිබඳ ජාත්‍යන්තර උපදෙස් (2006

ඒකාබද්ධ සංග්‍රහය) මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලය හා UNAIDS

http://www.ohchr.org/english/issues/hiv/guidelines.htm

[40.] ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්ති කමිටුවේ 14 වැනි පොදු නිර්දේශය බලන්න. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අදාළ සන්දර්භය තුළ නව යෞවන සංවර්ධනය හා සෞඛ්‍යය (2003) පරි. 8. ළමයාගේ අදහස්වලට ගරු කිරීම : නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය හා ඒවා නිසි පරිදි පිළිගනු ලැබීම ද (වගන්තිය 12) නව යෞවනයින්ගේ සෞඛ්‍යය හා සංවර්ධනයට ඇති අයිතිය සඳහා මූලික වෙයි. සියලු පාර්ශව නව යෞවන වියේ පසුවන අය හට තමන්ට බලපාන කරුණු විෂයයෙහි සිය අදහස් නිදහසේ ප්‍රකාශ කිරීමට (විශේෂයෙන් ම පවුල පාසල හා ජන සමාජයේ දී) නිර්ව්‍යාජ අවස්ථා ලබා දීම තහවුරු කළ යුතු ය. නව යෞවන වියේ පසුවන අය සඳහා මෙම අයිතිය ආරක්ෂිත හා නිසි අයුරින් භුක්ති විඳීම සඳහා රාජ්‍ය බලධාරීන්, දෙමාපියන් හා ළමයින් සම්බන්ධව සහ ළමයින් සමඟ කටයුතු කරන වැඩිහිටියන්, විශ්වාසය, තොරතුරු හුවමාරුව හා තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී නව යෞවනයන්ට සමාන ලෙස සහභාගී වීම පහසුකෙරෙන ඇහුම්කන් දෙන සහ මඟපෙන්වන පරිසරයක් නිර්මාණය කරනු ලැබිය යුතු ය.

[41] බලන්න, මානව හිමිකම් කමිටුවේ පොදු නිර්දේශ 28 ,ස්ත්‍රීන් හා පුරුෂයන් අතර අයිතිවාසිකම්වල සමතාව.,

එසේම, Yogyakatra Principle 22 .....

[42.] දේශපාලන හා සිවිල් අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, 1996, වගන්තිය 9.1: සියලු දෙනා හට පුද්ගල ආරක්ෂාවේ හා නිදහස සඳහා අයිතිය ඇත. කිසිඳු පුද්ගලයෙකු අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනීම හෝ රඳවා තබා ගැනීමට භාජනය නොකළ යුතු ය. කිසිඳු අයකුගේ නිදහසට නීතියෙන් ස්ථාපිත පරිපාටි හැරුණු විට සීමා නොපැවිය යුතු ය.

[43]සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, වගන්තිය 7 : කිසිඳු අයෙකු වධයට හෝ කෲර, අමානුෂික හෝ අවමන්සහගත සැලකිල්ලකට හෝ දඬුවකට භාජනය නොකළ යුතු ය. විශේෂයෙන් ම කිසිඳු පුද්ගලයෙකු සිය කැමැත්තෙන් තොරව වෛද්‍යමය හෝ විද්‍යාත්මක පරීක්ෂණවලට භාජනය නොකළ යුතු ය.
වධ හිංසාවට එරෙහි කමිටුව මධ හිංසාවට, කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලට එරෙහි එරෙහි ආරක්ෂාව එක්සත් ජනදපයේ සිර ගෙවල්වල හිඳින කාන්තා රැඳවියන් හට සිදුවන ලිංගික හිංසනයට එරෙහි ව භාවිත කර ඇත.
මෙම කමිටුව තවදුරටත් වධ හිංසාවට, කෲර, අමානුෂික හා අවමන් සහගත සැලකිල්ලට එරෙහි ආරක්ෂාව අපයෝජනාත්මක - හා සමලිංගික හෝ ලිංගත්වයට ඇතුළත් නොවන පුද්ගලයන් වැනි හැසිරීම් විෂයයෙහි ද භාවිත කර ඇත.
වධහිංසාවට එරෙහි විශේෂිත නියෝජිතයා ලිංගික හෝ ලිංගත්ව අනන්‍යතාව හේතුවෙන් පුද්ගලයන්ට එල්ලවන ලිංගික පහරදීම්, මෙන්ම වධ හිංසා හා කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලි සම්බන්ධයෙන් සිය බලවත් සංවේගය ප්‍රකාශ කර ඇත.

[44]ශාරීරික ඒකාග්‍රතාව පිළිබඳ අයිතිය සියලු දෙනා විශේෂයෙන් ම කාන්තාවන් ශාරීරික සෞඛ්‍යය අහිමි පිරිහීමට ලක් කරන ප්‍රචණ්ඩත්වය හා අනෙකුත් අපයෝජනවලින් ආරක්ෂා කිරීම සඳහා හා පුද්ගල නිදහස සහ වධ හිංසාවලින් නිදහස සඳහා අවශ්‍ය වගකීම් රාශියක් සඳහා සම්පත් වැඩි වශයෙන් යොදා ගැනේ. UNDOC. A162/122/Add at para 277.

[45]බීජිං ප්‍රකාශය හා ක්‍රියාකාරකම් පදනම ක්‍රියාත්මක කිරීමේ පස් අවුරුදු සැලසුමෙහි ප්‍රතිඵල විශ්ලේෂණය, එ.ජ. මහා මණ්ඩල රැස්වීම් තීරණ A/Res/s-23/3 පරි. 69. http://www.un.org/womenwatch/daw/follownp/ress233e.pdf

[46]බලන්න මානව හිමිකම් ආරක්ෂා කරන්නෙන්ගේ තත්වය පිළිබඳ මහ ලේකම්ගේ විශේෂ නියෝජිතයාගේ වාර්තාව. E/CN.4/2006/95/Add.1.March.22, 2006; කාන්තාවන්ට එරෙහි හිංසනය එයට හේතු හා ඵලවිපාක පිළිබඳ විශේෂි නියෝජිත, E/VN.4/2005/ මානව හිමිකම් කමිටුව, අවසාන නිරීක්ෂණ chils, CCPR/C/79/Add.104, මාර්තු 30" 1999" para 20 Report of the Special

Rapporteur on extrajudicial, summary or arbitrary executions. E/CN.4/2001/9, January 11, 2001 and E/CN.4/2001/9/Add. 1, january 17, 2001, para 175.
See also, International Commission of Jurists, Sexual Orientation and Gender Identity in Human Rights Law., References to Jurisprudence and Doctrine of the United Nations Homan Rights System, October 2007, at:
http://www.icj.org/news.php3?id_article=42097lang=en

[47.]මෙම කරුණ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ පැහැදිලි ව දක්වා ඇත. උදාහරණ සඳහා කාන්තාවන්ගේ තත්වය පිළිබඳ කොමිෂන් සභාව, ස්ත්‍රී ලිංගභේදනය නිම කිරීම පිළිබඳ යෝජනාව 51/2, ගැහැණු ළමුන් සඳහා බලහත්කාර විවාහය පිළිබඳ යෝජනාව 51$3UN Doc.E/2007/27 - E/ CN.6/2007/at ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තුළ ඇති සංස්කෘතික පුරුදු E/CN.4/2002/83 2002 ජනවාරි 31

[48.]මානව හිමිකම් හා එච්.අයි.වී. ඒඩ්ස් පිළිබඳ අන්තර්ජාතික උපදෙස් 2006 ඒකාබද්ධ පිටපත. එ.ජ. මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලය හා
තවදුරටත් බලන්න, ,යුරෝපයේ ලිංගික ශ්‍රමිකයන් පිළිබඳ ප්‍රකාශය, හා ,යුරෝපීය ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය,
[49.]මානව හිමිකම් හා එච්.අයි.වී. ඒඩ්ස් පිළිබඳ අන්තර්ජාතික උපදෙස් 2006 ඒකාබද්ධ පිටපත. එ.ජ. මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලය හා
තවදුරටත් බලන්න. http://www.ohchr.org/english/issues/hiv/guidelines.htm
See also, Yogyakarta Principle 7.

[50']See Yogyakarta Principle 5.

[51.]මානව හිමිකම් යෝජනා සඳහා වන කොමිෂන් සභාව 1998/52, ,කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටුදැකීම,, (1998)ත කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, ඒ සඳහා හේතු හා එහි පළ විපාක පිළිබඳ විශේෂ නියෝජිත වරියගේ වාර්තාව, රාදිකා කුමාරස්වාමි මිය, (මානව හිමිකම් යෝජනා පිළිබඳ කොමිෂන් සභාව 1997/44 අනුව ඉදිරිපත් කරන ලදි. UN Doc E/ CN.4/1998/54

ලිංගිකත්වය මත පදනම් වූ සමලිංගික වශයෙන් හඳුනා ගත් හා ලිංගයකට අයත් නොවන අයට සම්බන්ධ හිංසා පැමිණවීම් පිළිබඳ විස්තර සඳහා හා රැකවරණ සඳහා බලන්න.

[52]එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් (UNHCR& , සරණාගතයන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම හා පිටුදැකීම පිළිබඳ උපදෙස්. 1995

[53]එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහකොමසාරිස් (UNHCR), සරණාගතයන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම හා පිටුදැකීම පිළිබඳ උපදෙස් 1995.
වැඩි විස්තර සඳහා, එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් ( UNHCR) සරණාගතයන්ට, නැවත සියරට පැමිණෙන්නට හා අභ්‍යන්තරව අවතැන් වූවන්ට එරෙහි ලිංගික හා ලිංගිකත්වය පදනම් වූ ප්‍රචණ්ඩත්වය. ප්‍රතිචාර දැක්වීම හා පිටුදැකීම සඳහා උපදෙස් (2003) සහ 23.

[54]සිවිල් හා දේශපාලනික හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, වගන්තිය 17: කිසිඳු පුද්ගලයෙකුගේ පෞද්ගලිකත්වය, පවුල, නිවස හෝ ලිපි ගනුදෙනු කෙරෙහි අත්තනෝමතික හෝ නීතිවිරෝධී මැදිහත්වීමක් නොකළ යුතු අතර ඔහුගේ හෝ ඇයගේ කීර්තිය හා ගෞරවයට හානි නොපැමිණ විය යුතු ය.

[55]බලන්න: ලෝක සෞඛ්‍ය සංවිධානය, "HIV Status disclosure to sexual partners: Rates, Barriers and outcomes for women; (ලිංගික සහකරුවන් හට එච්. අයි.වී. තත්ත්වය හෙළි කිරීම: කාන්තාවන්ට ඇති බාධක හා ඵල විපාක) (Geneva: WHO, 2004)
http://www.who.int/gender/documents/en/VCTinformationheet-%b5b92%20KB%5d.pdf
For full report http://www.who.int/gender/documents/en/genderdimensions.pdf

[56]'See Yogyakarta Principle 9.

[57]'Yogyakarta Principle 9.

[58] පීඩා කිරීම, දඬුවම් කිරීම හා පුද්ගලයන් විශේෂයෙන් ම කාන්තාවන් හා ළමයින් නීති විරෝධී ලෙස ප්‍රවාහනය කිරීම වැලැක්වීම සඳහා වූ එ.ජ. කෙටුම්පත. (එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි සම්මුතියට අතිරේක වශයෙන් එක් කරන ලද්දකි.)
http://www.unodc.org/unodc/en/crime-cicp-convention.htm#final

[59]'Yogyakarta Principle 19.

[60] මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, 1948, වගන්තිය 19 සියලු දෙනා හට ප්‍රකාශනයේ හා අදහස් දැරීමේ අයිතිය ඇති අතර එයට බාධාවකින් තොරව අදහස් දැරීමේ නිදහස හා දේශසීමා බාධකවලින් තොරව තොරතුරු ලබා ගැනීමට හා සන්නිවේදනය කිරීමට ඇති නිදහස ද ඇතුළත් ය

[61]'Yogyakarta Principle 19.

[62] මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, වගන්තිය 20: සෑම අයෙකුට සාමකාමී ලෙස නිදහසේ රැස්වීමේ හා සංවිධානය වීමේ හිමිකම ඇත. කිසිඳු අයෙකු හට සංවිධානයකට එක්වීම සඳහා බල නොකළ යුතු ය.

[63] ජාත්‍යන්තර අර්ථික, සාමාජයීය හා සංස්කෘතික සම්මුතිය, වගන්තිය 12.1: වත්මන් ප්‍රඥප්තියට අදාළ සියලු පාර්ශව සියලු දෙනා හට ළඟා කර ගත හැකි උපරිම මට්ටමේ මානසික හා ශාරීරික සෞඛ්‍යය භුක්ති විඳීමේ හිමිකම ඇත.

[64] ආර්ථික, සමාජයීය හා සංස්කෘතික හිමිකම් පිළිබඳ කමිටුව, පොදු නිර්දේශ 14: ළඟා කර ගත හැකි ඉහළම සෞඛ්‍ය තත්වය සඳහා ඇති අයිතිය (ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ වගන්තිය 12, 2000)

[65] ලිංගික හා ප්‍රජානක අයිතීන් පිළිබඳ IPPF ප්‍රකාශය වැඩි විස්තර සඳහා
http://www.ippf.org/en/Resources/Statements/IPPF+Charter+Sexual+and+Reproductive+Rights.htm
See also, Yogyakarta Principal 21.

[66] ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, වගන්තිය 15.1 (4) වත්මන් සම්මුතියට අදාළ සියලු පාර්ශව විසින් සෑම පුද්ගලයකු හට ම ..... (ආ) විද්‍යාත්මක දියුණුවේ ප්‍රතිඵල හා ඒවායේ ප්‍රායෝගිකත්වය අත්විඳීමේ හිමිකම හඳුනා ගත යුතු ය.

[67] කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් පිටුදැකීමේ ප්‍රඥප්තිය, වගන්තිය 10(ය) සියලු පාර්ශව කාන්තාවන් හට අධ්‍යාපනයේ දී පිරිමින් හා සම අයිතීන් ලැබීමට හා විශේෂයෙන් ම ස්ත්‍රීන් හා පුරුෂයන් අතර සමාන තත්වයක් ලැබීමට ඇති වෙනස් කොට සැලකීම පිටු දැකීමට හා උපදෙස් ඇතුළුව පවුලේ සෞඛ්‍යය හා යහපත සුරක්ෂිත කිරීමට උදව් වන විශේෂිත අධ්‍යාපන තොරතුරු වෙත ප්‍රවේශ වීමට අයිතිය ඇත.

[68] බලන්න සංවර්ධනය හා ජනගහනය පිළිබඳ ජාත්‍යන්තර සංවර්ධනය හා ජනගහනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ ක්‍රියාකාරී වැඩසටහන තවදුරටත් ක්‍රියාවේ යෙදීම සඳහා වන ප්‍රධාන ක්‍රියාකාරකම්, UNDOC.A/Res/s-21/2, mß'73.

> ආණ්ඩු, ජාත්‍යන්තර ප්‍රජාවගේ සහයෝගය හා තරුණ පිරිසගේ පූර්ණ සහභාගිත්වය ඇතිව ක්‍රියාකාරී වැඩසටහන් 7.45 හා 7.46 පරිච්ඡේද හා සමගාමී ව නව යෞවන ලිංගික හා ප්‍රජානක සෞඛ්‍ය ක්‍රියාත්මක වැඩසටහන ප්‍රමුඛ කාර්යයක් ලෙස ක්‍රියාවේ යෙදවීමට සියලුපියවර ගත යුතු අතර.... දෙමාපියන්ගේ හිමිකම්, යුතුකම් හා වගකීම් කෙරෙහි නියමිත ගෞරවය දක්වමින්, නව යෞවනයන් හට ප්‍රජනක සෞඛ්‍ය අධ්‍යාපනයට, තොරතුරු හා රැකබලා ගැනීමට ඇති අයිතිය හා නව යෞවනයින්ගේ වර්ධනය වන ශක්‍යතා අනුව යමින්, නව යෞවනයන්, පාසල තුළ දී හා ඉන් බැහැර දී ද, අඩු වයස් ගැබ් ගැනීම් අඩු කිරීම සඳහා ඔවුනට සිය ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යය පිළිබඳ වගකීම් සහිත හා දැනුවත් වූ තෝරා ගැනීම් සිදු කිරීම සඳහා හැකිවන අධ්‍යාපන, උපදේශන හා වැළැක්වීම පිළිබඳ ව වූ අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ අයිතිය තහවුරු කළ යුතු ය.

http://www.unfpa.org/icpd/does/icpd5/resolution/icpd5-eng.pdf.

[69.]ලිංගික හා ප්‍රජනක අයිතීන් පිළිබඳ IPPF සම්මුතිය. 8.1

Adopted by IPPF Governing Council, 10 May 2008

http://www.ippf.org/en/Resources/Statements/IPPF+Charter+on+Scxual+Reproductive+Rights.htm

[70’]Yogyakarta Principal 24.

[71.]කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් පිටු දැකීම සඳහා වන ප්‍රඥප්තිය, වගන්තිය 16 (1) (e) : සියලු පාර්ශව, විවාහය හා පවුල් සම්බන්ධතා විෂයයෙහි සියලු කාරණාවල දී කාන්තාවන්ට එරෙහි ව සිදුවන වෙනස්කම් පිටුදැකීම සඳහා අවශ්‍ය සියලු පියවර ගත යුතු අතර විශේෂයෙන් ම කාන්තාව හා පිරිමියා සම තත්වයක තබා .... (e) දරුවන් ගණන හා දරුවන් අතර පරතරය නිදහස්ව හා වගකීම් සහිතව තීරණය කිරීමට මෙන් ම මෙම අයිතීන් ක්‍රියාවේ යෙදවීම කාන්තාවන්ට හැකියාව ලබා දෙන තොරතුරු, අධ්‍යාපනය හා ක්‍රමවේද සඳහා ප්‍රවේශ වීමට ඇති අයිතිය සුරක්ෂිත කළ යුතු ය.

[72’]Yogyakarta Principal 28 and Yogyakarta Principal 29.

Adopted by IPPF Governing Council, 10 May 20082q

.